# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 ඇසළ මස 19 වන කුජ දින ■ 2016 ජූලි මස 19 වැනි අඟහරුවාදා



■ හොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# පන්සලට පාට ඇඳුම් තහනම්ද?

## පූජ්‍ය ගෝණදෙණියේ සීවලී හිමි පහදා දෙති

විහාරස්ථානයකට හෝ වෙනත් පූජනීය ස්ථානයකට යනවිට ඇයි අපි සුදු ඇඳුමින් සැරසිය යුත්තේ? පාට ඇඳුම් ඇඳීම අකැපද? නැතිනම් නොයෙක් වර්ණ සහිත වස්ත්‍රාභරණවලින් සැරසී ගිය විට අපට පව් සිද්ධ වෙනවාද? මෙහි සැබෑ අරුත කුමක්ද? මොහොතකට අපි ඒ ගැන කතා කරමු. ඒ ගැන කරුණු පහදා දීමට අප සමග එක්වන්නේ කොළඹ හුණුපිටිය ගංගාරාමවාසී පූජ්‍ය ගෝණදෙණිය සීවලී හිමිය.

❐ පෝය දින සහ වෙනත් දිනවලදී ඇයි අප පන්සලට සුදු ඇඳුමින් සැරසිය යුත්තේ? එය අප කළ යුතුමද? මේ ගැන නොදන්නා අයට කරුණු පැහැදිලි කළොත්?

සුදුම අඳින්න ඕනෑය කියාලා නියතයක් නැහැ. අපි හිතමු කාට හෝ සුදු ඇඳුමක් නැහැ කියලා. එහෙම නම් තියෙන ඇඳුම අඳින්න වෙනවා. සුදු වස්ත්‍රය බොහෝ විට ආගමික ස්ථානයකට ගැලපෙනවා. අන්න ඒ නිසා ස්ථානයට උචිත වන හෙයින් සුදු ඇඳුම් බොහෝ දෙනා විසින් පළඳිනු ලබනවා. ඇයි සුදු තෝරාගත යුත්තේ? ඇත්තටම ඇයි අපි ආගමික ස්ථානයකට යන්නේ? අපි ආගමික ස්ථානයකට යන්නේ සිත පහදා ගැනීමටයි, සිතට සැහැල්ලුවක් ලබාගෙන මනස පීඩාවෙන් දුරු කරගන්නයි. මෙකී සියල්ලට සුදු ඉතා සමීපයි. හිතට, මනසට ගෙන දෙන්නේ පහන් බවක්. මෙන්න මේ නිසා සුදු ඇඳුමින් සැරසී පන්සල් භූමියට එන පිරිස බොහෝමයි.

❐ නමුත් සමහර අය අතර මතයක් තිබෙනවා, එනම් බෞද්ධ කොඩිය පාට සහිත නිසා පන්සලට පාට ඇඳුමින් සැරසීම ප්‍රශ්නයක් නැහැ කියා?

එය අප කිසිසේත්ම පටලවා නොගත යුතුයි. සුදු ඇඳුම ගැන අප තවත් කතා කළොත් එය පිරිසිදු බව, පාරිශුද්ධ බව ගෙන දෙන දෙයක්. බෞද්ධ කොඩිය යොදා ඇත්තේ බුදුන් වහන්සේ වෙතින් බඹයක් පමණ දුරට විහිදී ගිය රශ්මි මාලාව එනම් ඒ දීප්තිමත් බව පරිසරය සංකලන සමග අපට දිස් වුණේ ෂඩ් වර්ණ සමගයි.

අන්න ඒ අනුමාන බවට සාපේක්ෂව තමයි බෞද්ධ කොඩිය නිර්මාණය වී තිබෙන්නේ. එය අප බුදුන්ට කරන ඉමහත් ගෞරවය, භක්තිය නිසා කළ දෙයක් හැටියට හඳුන්වන්න පුළුවනි. ඒ නිසා එය පටලවා ගැනීම උචිත නැහැ. අනෙක බුදු දහමේ කොතැනකදීවත් සුදු පාට විතරක් අඳින්න, අනෙක් වර්ණ අඳින්න එපා කියලා සඳහන් වෙලා නැහැ. වර්ණ සහිත ඇඳුම්වලින් බොහෝ විට සිතිවිලි කැළඹීමට පුළුවන්. අපි පන්සලට එන්නේ සිත සමාධිගත කරගැනීමට නම් වඩා සුදුසු සුදු පැහැයයි.

❐ මේ ගැන නොදන්නා බොහෝ අය පාට ඇඳුම් ඇන්දම (පන්සලට) පව් සිද්ධ වෙනවා කියලා කියනවනේ. මේ ගැනත් අපි පැහැදිලි කරමු?

එහෙම පවක් සිද්ධ වෙන්නේ නැහැ. එය හිතාමතාම කරනවා නම් තමයි ප්‍රශ්නය. එය තමුන්ගේ අධ්‍යාත්මය පිළිබඳ ප්‍රශ්නයක් විය හැකියි. කෙනෙක් එහෙම කරනවා නම් එයින් ප්‍රකාශ වෙන්නේ ඔහු හෝ ඇය අවස්ථාවට උචිත වන ලෙස අඳින්න පළඳින්න දන්නේ නැහැ කියන එකයි. ඇයි අපි මල ගෙදරට සුදු අඳින්නේ? එතැනදී අපේ සිත ඒකාත්මික කරගැනීමටයි. එතැනදී ආකර්ෂණයක් පෙන්නුම් කෙරෙන්නේ නැහැ. වර්ණය බොහෝ විට සිතිවිලි කළඹනවා. සිතිවිලි වේගවත් කරවන සුළුයි. නමුත් අපි ස්ථානයට උචිත විදියට එය ගලපා ගැනීම ඉතා වැදගත්.

❐ සුදු පාට සහිත වස්ත්‍ර සමහර අය අඳින්නේ සිරුරේ රිද්මය ඕනෑවට වඩා ආකර්ෂණයට නතුවන විදියටයි. ඒ නිසා සුදු ඇඳීම කළත් මේ උලුප්පා ඇඳීම නිසා අනෙක් අයගේ සිත් තුළ කැළඹීම් සිදුවෙනවා නේද?

ඇත්තටම එහෙම කරන්නේ බොහෝ විට අපේ කාන්තා පක්ෂයේ ඉතා සුළු පිරිසක්. එය එයාලාගේ නොදැනුවත්කම හෝ වුවමනාව මත විය හැකියි. නමුත් මේ සියල්ලට බලපාන්නේ තමාගේ ඥානයයි. තමා කොතරම් දැනුවත්ද, දහමට කොතරම් නැඹුරුද, සමාජය ගැන කොතරම් ස්පර්ශ බවක් තිබෙනවාද ආදී බොහෝ දේ හෙවත් තමාගේ අධ්‍යාත්මය අනුවයි.

❐ කවුරු කොහොම මොන විදිහට ඇඳුම් ඇන්දත් සිතිවිලි පාලනය කරගත යුත්තේ තම නැණ පමණින් නේද? සිත පාලනය කරගත හැකි නම් ඔය කිසිවක් ප්‍රශ්න නොවෙයි නේද?

සැබෑය. නමුත් හැමෝගේම සිත් එක වගේ නෙවෙයි. සමහර විට සමාධිගත කරගත් සිත එක් සැණෙකින් කැළඹීම විය හැකියි. හරියට අළු ගොඩකට ගලක් ගැසුවාක් මෙන්. ඒ නිසා අපි දැනුවත්ව අන් අය කැළඹීමට පත් නොකර සිටිය යුතුයි. එය අපේ දැනුවත් භාවයයි.

විශාඛා මහා උපාසිකාව ගැන සිහිපත් කරද්දී ඇය කොතරම් ශරීර ලක්ෂණවලින් පොහොසත් වුණත් ස්ථානය අනුව ඇඳීම සිදුකළ බව සඳහන් වෙනවා. සුදු පාටට ඇය බෙහෙවින් සමීපව සිටි බව සඳහන් වෙනවා. අපි හැබෑවටම සිත කය සංවර කරගත යුතුයි. එය ඇති වන්නේ තමන්ගේ සිතිවිලිවලින්.

**ධර්ම ගවේෂක**

"මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."

# බිරිඳකගේ සැනසුම උදෙසා සැමියකුගේ යුතුකම්



සාර්ථක පවුල් ජීවිතයක් සඳහා බිරිඳ, සැමියා වෙත පැවැතිය යුතු ආකාරයත්, සැමියා බිරිඳ වෙත පැවැතිය යුතු ආකාරයත් බුදුරජාණන් වහන්සේ විසින් සවිස්තරව වෙන් වෙන් වශයෙන් දේශනා කළ සේක. අප කතා කරන්නේ සැමියකු විසින් බිරිඳක් වෙත ඉටුකළ යුතු යුතුකම් පිළිබඳවයි.

මෛත්‍රී ගුණය දියුණු කළ හැක්කේ යුතුකම් ඉටු කරන්නාට බව බුද්ධ දේශනාවෙහි සඳහන්ය. යුතුකම් ඉටු කළ හැක්කේ මෛත්‍රී සහගත සිතින් කටයුතු කරන්නාටය. ඒ අනුව යුතුකම් ඉටු කරන විට මෛත්‍රී ගුණයත් ඉබේම වැඩෙයි. සියලු සත්වයෝ සුවපත් වේවා යැයි කී පමණින් සත්වයන් සුවපත් වන්නේ නැත. සුවපත් වන ආකාරයට තමන් කටයුතු කළ යුතුය.

මේ සැමියකු විසින් බිරිඳක වෙත පැවැතිය යුතු ගුණ පහ වේ.

## 1. සම්මානනාය

මෙහි සරල අදහස නම් තම බිරිඳට ගරුත්වයක් ලැබෙන අයුරින් ඇයට කතා කිරීමය. සමහරු තම බිරිඳ පිරිසක් ඉදිරියේ ලජ්ජාවට, අපහසුවට පත්වන අයුරින් විවිධ අපහාස නගමින් විනෝද වෙති. මෙය බිරිඳගේ සිත මහත් පීඩාවට පත්කරවන තත්ත්වයක් වේ. තමන්ගේ නිවස පාලනය කරමින්, තමන්වත්, දරුවන්වත්, නිවසත් බලා කියාගන්නා බිරිඳගේ ගෞරවය රැකෙන අන්දමින් කතා කිරීම හැම සැමියකුගේම වගකීමය. ඇගේ යහපත් ගතිගුණ අගය කළ යුතුය. කඩේ බඩු කිරි දෙන වෙළෙඳ සේවකයාට 'ස්තුතියි' කියමින් බඩු මල්ල අතට ගන්නා පිරිමින් තමන්ගේ බිරිඳ සාදා දෙන තේ කෝප්පය බී ''තේ එක රසයි'' කියන්නට තරම්වත් කාරුණික වන්නේ නැත. එසේ කීම තුළ ඇත්තේද එක්තරා ආකාරයක ස්තුති කිරීමකි.

ඕනෑම මනුෂ්‍යයකු තමන් අනිකකු විසින් අගය කරනු දකින්නට ප්‍රිය කරයි. නමුත් වැඩි දෙනෙක් පුරුදු වී හිඳින්නේ හොඳක් දුටු විට යට ගසන්නට සහ සුළු නරකක් වුවද වැඩි වැඩියෙන් ඉස්මතු කරන්නටය. අනුන්ගේ ගුණයක් දුටු විට ඒ ගැන සතුටින් කතා කිරීම යනු මුදිතා ගුණයයි. නුවණැත්තෝ අනුන්ගේ ගුණ වැයීම තුළිනුත් කුසල් අත්කර ගනිති. ගුණ යටපත් කිරීම යනු ගුණමකු වීමකි.

බොහෝ සැමියන් තමන්ගේ බිරිඳගේ හොඳක් දකින්නේම නැත. නමුත් අනුන්ගේ භාර්යාවන්ගේ හොඳ නම් ඔවුන්ට වැඩි වැඩියෙන් පෙනේ. ඥාතියකුගේ හෝ හිතවතකුගේ නිවසකට තම බිරිඳ හා දරුවන් සමග කෑමකට ආරාධනා ලැබ එහි යන ඇතැම් සැමියන් කෑම ගෙන අවසන් වූ පසු ''**කාලෙකට පස්සෙ කටට රහට කෑම වේලක් කෑවා**'' යයි කියන්නේ ඒ ගෙදර කාන්තාව සතුටු කරන්නටත් ඇයට තුති පිදීමක් ලෙසිනුත් විය හැකිය. නමුත් ඉන් ඇඟවෙන්නේ කුමක්ද? තමන්ගේ බිරිඳ

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''

කවදුවත් රසට කෑම පිසින්නේ නැති බව නොවේද? එය බිරිඳට කළ කොතරම් ලොකු අවමානයක්ද?

## 2. අනවමානනාය

"ඔයාගෙ ගෙවල්වල මිනිස්සුන්ගෙ හැටි මං දන්නෙ නැද්ද? ඔයා අද මෙහෙම ඉන්නෙ මං එක්ක ආපු හින්දයි. නැත්නම් බලන්න තිබුණා ඔයාට වෙන දේ" ආදි වශයෙන් බිරිඳගේ පවුලේ අයගේ දෙස් දකිමින් බිරිඳට අවමන් කරන සැමියන් මේ සමාජය තුළ අඩුවක් නැත. සමහරුන් මේවා කියන්නේ නිවස තුළදී පමණක් නොවේ. ප්‍රසිද්ධියේ අන් අය ඉදිරියේත් කියති. මෙය බිරිඳට මානසික වශයෙන් කරනු ලබන විශාල හිංසනයකි. කිසිදු යහපත් ගුණගරුක සැමියකු තමන්ගේ බිරිඳට එවැනි චිත්ත පීඩා ගෙන දෙන්නේ නැත.

## 3. අනතිචරියාය

මෙහි අරුත අනාචාරයේ නොයෙදීමයි. තමන්ගේ බිරිඳ සමග පමණක් කාමයේ හැසිරීම සෑම සැමියකු විසින්ම දැඩිව සිතට ගත යුතු කරුණකි. මෙහිදී කායික ක්‍රියාකාරකම් හැරුණු විට මත්පැන්, දුම්පානය, රාත්‍රී සමාජ ශාලාවන්හි හැසිරීම යන මේවාද අනාචාරය යටතට ගත හැකිය. ආචාර යනු හොඳ හැසිරීමයි. අනාචාර එහි ප්‍රතිවිරුද්ධ පැත්තය.

## 4. ඉස්සරිය වොස්සග්ගේන

එහි අරුත අයිශ්වර්ය පවරා දීමය. එනම් නිසේ කටයුතු භාර දීමය. සමහර සැමියන් තමන් උපයන මුදල් බිරිඳට පෙන්වන්නේවත් නැත. නිවසට සියලු දේ ගෙන එන්නේත් ඔහුමය. නිවසේ තීරණ ගන්නේත් ඔහුමය. බිරිඳට කිසිදු දේක වගකීමක් පවරන්නේ නැත. ඇය කරන්නේ ඔහුගේත්, දරුවන්ගේත්, නිවසේත් වැඩපළ පමණක් ඉටු කරන මෙහෙකාරියකගේ භූමිකාවය. ඕනෑම මනුෂ්‍යයකු තමන්ට නිසි තැන ලැබීම අපේක්ෂා කරයි. ඒ අනුව බිරිඳට නිවසේ පාලනය දෙමින් යමක් කිරීමේදී ඇගේද අදහස් විමසමින් ක්‍රියාකරන විට බිරිඳ මහත් සතුටට පත්වන අතර සැමියා කෙරෙහි ඇගේ ගරුත්වය වැඩි වීමටද එය හේතුවෙයි.

## 5. අලංකාරානුප්පදානේන

ඕනෑම කාන්තාවක් ඇඳුම් පැළඳුම් වැනි විසිතුරු දේවල්වලට ඉමහත් ආශාවක් දක්වීම ස්වභාවයකි. එනිසා ඇගේ උපන් දිනයට, විවාහ සංවත්සර දිනයට ඇය වෙනුවෙන් තෑග්ගක් පිරිනමා ඇගේ සිත සතුටු කිරීමට හැකිවිය යුතුය. ඒ හැරුණු විට තමන්ට හැකි සෑම අවස්ථාවකදීම බිරිඳ වෙනුවෙන් ඇඳුමක් පැළඳුමක් රැගෙන දීම, ඇයත් සමගම ගොස් ඇය කැමති දෙයක් තෝරා ගැනීමට ඉඩ දීම හෝ ඇයට එවැනි දෙයක් මිලදී ගන්නට මුදල් දීම සැමියකු වෙතින් ඉටුවිය යුතු යුතුකමකි. තමන්ගේ ආදායමට සරිලන පරිදි සැමියකු මෙවැනි දෙයක් කරන විට බිරිඳගේ සිතේ ඔහු කෙරෙහි ආදර ගෞරවය වැඩි වන්නේ ඉබේමය.

**මහාචාර්ය පාතේගම ඥාණිස්සර හිමි**



"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

# රහතුන් අහසින් වඩින විට උන්වහන්සේලාගේ ශරීරය පහළට පෙනෙනවාද?

## වෛද්‍ය විද්‍යාව ඉගෙන ගැනීමේදී සතුන් මැරීමෙන් පව් සිදුවෙනවාද?

## නිදන කාමරයක බුදු රූ රැසක් එල්ලා තැබීම නුසුදුසුද?

**මිරිස්සේ ගුණසිරි හිමියෝ පිළිතුරු දෙති**



❒ රහතුන් අහසින් වඩින විට උන්වහන්සේලාගේ ශරීරය පෙනේද? දැනුත් රහත්හු සිටිත්ද?

රහතුන් වහන්සේලා අහසින් වඩින විට ඊට උන්වහන්සේලාගේ අධිෂ්ඨානයේ හැටියට පිට අයට පෙනීම හෝ නොපෙනීම විය හැකිය.


දැනුත් රහතුන් සුද්ධාවාසයෙහි සිටින බව නම් ඒකාන්තය. මිනිසුන් අතර අධිගම අන්තරධානයේ හැටියට යටත් පිරිසෙයින් අනාගාමී ආර්ය පුද්ගලයන් සිටින බව කිව හැකිය.


❒ වෛද්‍ය විද්‍යාල ප්‍රවේශය සඳහා සූදනම් වන ශිෂ්‍යයන්ට සතුන් මරා ඉගෙනීමට සිදුවේ. කේන්තියෙන් සතකු මරණ විටක මෙන්ම ප්‍රාණඝාතය එයින් සිදුවේද?

සතකු ජීවත් වන බව දැන දැන මරන්ට සිතා ඔහු දිවියෙන් තොර කිරීම නිසා ඇති වන ප්‍රාණඝාත අකුසලයේ අඩු වැඩි බවක් වෙනවා නම් ඒ සතා නැසීමට සිතන මතන උපක්‍රමයයේ හා එයින් මැරෙන සතාගේ ගුණ ධර්මවල අඩු වැඩි බව නිසා විය යුතුය. එසේ බලන කල ඇතකු මැරීමේ සහ මදුරුවකු තැලීමේ ප්‍රාණඝාත දෙක සම විය නොහැකිය. ගුණහීන මිනිසකුගේ දිවි තොර කිරීමේ සහ ගුණසම්පන්න පුද්ගලයකුගේ දිවි තොර කිරීමේත් විපාක සම විය නොහැකිය. ආනන්තරීය අකුසලයන් අතර මවුපිය දෙන්නා සහ රහතුන්ගේ දිවි තොර කිරීම ඇතුළත් වීමද මේ සම්බන්ධයෙන් මතක් කළ යුතුය. ඒ නිසා වෛද්‍ය විද්‍යාව හැදෑරීමට කුඩා සතුන් මැරීම දරුණු මහා සාවද්‍ය ගණයට වැටෙන ප්‍රාණඝාත වශයෙන් පෙන්විය නොහැකිය. එහෙත් කිවයුත්තක් ඇත. එනම්, ප්‍රාණඝාත අකුසලයට අසුවල් කරුණ සඳහා අසුවල් ප්‍රමාණයේ සතකු මැරීම විකල්පයක් වශයෙන් පෙන්විය නොහැකි බවය. දැනටමත් ලෝකයේ නොයෙක් රටවල විද්‍යාව ඉගෙනීමට පවා සතුන් මැරීම නොකළ යුතු වැඩක් හැටියට පිළිගෙන එයට විරුද්ධව මහත් උද්ඝෝෂණයක් පැවැත්වේ. කෘත්‍රිම ශරීරාංගයන්ගෙන් මේ විද්‍යාව ඉගැන්වීමට හැකිද? යන ප්‍රශ්නයද බොහෝ දෙනා අසන ප්‍රශ්නයකි. ඒ නිසා හැකි නම් පුළුවන්තාක් දුරට සතුන් නොමරාම මේ විද්‍යාව ඉගෙන ගත හැකි නම් කෙතරම් අගේද? මේ සම්බන්ධයෙන් සප්පාණක ශික්ෂාපදය හා කුලාවක ජාතකාදිය බැලීම ප්‍රයෝජනවත් විය හැකිය.

❒ ලංකාවේ පළමුවෙන්ම තනවන ලද චෛත්‍යය ථූපාරාමයද, මියුගුණු සෑයද, හිරිගඩු සෑයද? පොත් පත්වල නොයෙක් ලෙස සඳහන් වන මෙය ගැන තීරණය කුමක්ද?

දැනට සොයාගත හැකි ඓතිහාසික සාධක අනුව ලක්දිව චෛත්‍ය නිර්මාණයේ පරිණාමය මෙසේය. බෝ මැඩදීම තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන්ට බුදුරදුන් දී වදාළ කේසධාතූන් නිදන් කොට ඔවුන් විසින් ලංකාවේ වෙරළ අසල තනවන ලද සෑය පසු කලෙක දියුණු කරන ලදුව හිරිගඩුසෑය නමින් ප්‍රකට විය. මියුගුණු සෑයේ නිදන් කළ කේශධාතු පිළිබඳ ඉතිහාසය පටන් ගන්නේ එයට මාස අටකට පසුය. ථූපාරාමය සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ලංකාවේ තැනවූ ප්‍රථම චෛත්‍යය වීමේ ගෞරවය හිමිකර ගනියි.





❒ ධර්මාශෝක රජු කෙතරම් පින්කම් කළද මැරී ගොස් හිමාල වනයේ පිඹුරකු වී උපන්නේ කුමක් නිසාද?

පුනරුත්පත්තිය සිදුවන්නේ මැරෙන මොහොතේ කර්ම, කර්මනිමිත්ත, ගතිනිමිත්ත යන තුනේ එක් අරමුණක් පහළ වී එහි හොඳ නරක දෙකට අනුවය. ධර්මාශෝකයන්ගේ චුති චිත්තය අවසාන මොහොතේදී තමන් ''චණ්ඩාශෝක'' සිටි කාලයේ දී කළ නරක කර්මයක එල්ලෙන්න ඇත. කර්ම විපාකවල සැටි ඔහොම තමයි.

❒ ''පන්සල'' යනු භික්ෂූන්ගේ වාසය පිණිස සැදුණු කොළ සෙවිලි කළ පැලකි. එසේ නම් දූන් භික්ෂූන් උළු සෙවිලි කළ සුඛෝපභෝගී මැදුරුවල විසීම සුදුසුද?

වචනවල මුල සොයන්නට ගියොත් ඔබට මේ ලෝකයේ මහ විහිළුවක් සේ පෙනෙන්නට වෙනවාට සැක නැහැ. ලතින් භාෂාවේ ''පෙනා'' කියන්නේ පිහාටුටය. මුලින්ම පිහාටු පෑනට යෙදූ ''පෙන්'' (පෑන) යන්නද, එය මුවහත් කිරීමට ගත් පොඩි පිහියට ''පෙන්නයිෆ්'' (පෑන පිහිය) යන්නද දූන් කෙතරම් වෙනස් දේවලට යෙදේ දූයි බලන්න.

''වෝහරවිසයො සද්දෝ - නේකන්තපරමත්ථිකො
බුද්ධිසංකප්පිතෙ අත්ථො - කස්සත්ථෝති පවුච්චති''

යන න්‍යායට අනුව ශබ්දය අර්ථය ගන්නේ ව්‍යවහාරයට අනුවය. එසේ බලන කල මුලින් කැලෑබදව විසූ තාපසයන් උදෙසා කොළ සෙවිලි කළ කුඩා කුටි සාදන්ට පටන් ගත් කාලයේ වහරට ආ පන්සල යන වචනය දූන් උළු සෙවිලි කළ මැදුරුවලටද ව්‍යවහාර කරනු ලැබේ. වචනය මුල් අයුරු තිබියදී එයින් කියවෙන ද්‍රව්‍යය වෙනස් වීම නොවැළැක්විය හැකිය. පණස් හතර කෝටියක් ධනය වියදම් කොට අනේපිඬු මහ සිටාණෝ කළ දෙව්රම් වෙහෙර, තඹපත් සෙවිලි කර ගැමුණු රජු කරවූ ලෝවා මහා ප්‍රාසාදය ආදී ''පන්සල්'' ගැන ඔබ කියන්නේ කුමක්ද? හැබැයි කිව යුත්තක් ඇත. රන් රිදියෙන් නිමවෙන ලද මාලිගා වැනි තැනක නමුත් එහි ඇලුම් නැතිව විසීමට හැකි නම් පැල්පතය, ප්‍රාසාදයය කියා පැවිද්දනට එයින් බාධාවක් නැත. ඔබ වචනය ඔස්සේ ගියේ කොහේදූයි දූන් කල්පනා කර බලන්න.

❒ සෑම රහතන් වහන්සේ කෙනකුටම අහසින් වැඩිය හැකිද? සෘද්ධි බලය පෑ හැකිද? රහත් වීමේත් යම් යම් ප්‍රභේද තිබේද?

කෙලෙස් වියළවා වීමෙන් පමණක් රහත් බව ලත් චක්කුපාල රහතන් වහන්සේ වැන්නවුන්ට අහසින් යෑමේ සෘද්ධි බලය නැත. ඒ අතර රහත් නොවූවද දේවදත්ත වැනි අහසින් යා හැකි සෘද්ධිවත්හුද වෙති. ඒ අතින් සලකන කළ අහසින් යාම රහත් බවේ අනිවාර්ය අංගයක් නොවේ. රහත් බවෙහි ප්‍රභේදයක් නැතද එය හා ලැබෙන අතිරේක හාස්කම්වල නම් වෙනසක් තිබෙන බව මෙයින් පෙනේ. සමථයානිකයාගේ වශයෙන් භාවනා පටන් ගෙන ධ්‍යානසමාපත්ති ලබා එයින් විදර්ශනාවට බැස රහත් ඵලය ලත් රහතන් වහන්සේලාට නම් රහත් බව හා සෘද්ධි බලය අනිවාර්ය වශයෙන්ම ලැබේ.

❒ අජාසත් රජ තම පියා මැරීමට තැත් කරද්දී බුදුරදුන් එය නොවැළැක්වූයේ ඇයි?

දේවදත්තයන්ගේ ඇසුරෙන් දරුණුව සිටි තරුණ අජාසත් බලකාමයෙන් අන්ධ වී සිටි නිසාය. බිම්සර රජුගේ මරණයද එද වැළැක්විය නොහී පැවැති නිසාය. කර්ම නියාමය ඔහොම තමා.

❒ නිදන කාමරයක බුදු රූ රැසක් එල්වා තැබීම සුදුසුද? එයින් අවැඩක් සිදුවේද?

හොඳ එක බුදුරුවක් හෝ පිළිමයක් ගෙයි ප්‍රමුඛස්ථානයක එල්ලන්න. නිදන කාමරය එතරම් සුදුසු යයි කියනු බැරිය. බුදුරුවට නිගා දෙන තැනක එල්ලීමෙන් වැඩක් නම් නැත.

❒ යෝගියකු භාවනාවෙන් කරන්නේ තාවකාලිකව සිත මෝහනයට පැමිණවීමකැයි මට සිතේ. මෙය පැහැදිලි කර දෙන්න?

මෝහනය යන්නෙන් ඔබ අදහස් කරන්නේ සමාධිය නම් ඔබ කියන දෙයෙහි වරදක් නැත. ''කුසල චිත්තෙකග්ගතා සමාධි'' යන විවරණයෙහි එන්නේ කුසල් සිතක ඇති වන ඒකාග්‍රතාව සමාධිය වේ යනුයි. එයින් නීවරණ ධර්මයන් විෂ්කම්භනය වී ධ්‍යාන සිත් පහළ වේ. මෝහනය යනු හුදෙක් විස්මෘතිය නම් ඔබේ මතය වැරදිය. වචන නිසා සමහරු මුලාවීමද නොවැළැක්විය හැකිය.

❒ පටිච්ච සමුප්පාදයෙහි එන අයුරු අවිද්‍යාව නිසා කුසලා කුසල කර්මයන් රැස්කෙරෙන බව කියවේ. අවිද්‍යාව මූලාවක් නම් එයින් කුසල කර්ම රැස්වන්නේ කෙසේද?

අවිද්‍යාව නම් දුඃඛාදී ආර්ය සත්‍යයන් පිළිබඳ නොදූනීමයි. ලෝකය එකම දුක් ගොඩක් වශයෙන් බැලිය යුතු වුවද අවිද්‍යාව නිසා දෙව් මිනිස් ලෝ සැප වශයෙන් ගෙන ඒ සැප ලැබීමට දනාදී පින්කම් රැස් කිරීම මෙහිලා අදහස් කරනු ලැබේ. දෙව්ලොව දිව සැපත්, බඹලොව බඹ සැපත් තාවකාලික හෙයින්, විපරිණාමයට පැමිණෙන හෙයින් දුක් වශයෙන් නොපෙනීම මෙහි ලා අවිද්‍යා නම් වේ.

❒ පව් පින් දෙකම නොකරන තැනැත්තා මරණින් මතු උපදින්නේ කොහිද?

පව් නොකිරීමද පින් කිරීමකි. දසකුසල වශයෙන් ගන්නේ දස අකුසල් නොකිරීමය. ධර්මානුකූලව කියනවා නම් පව් පින් දෙකම නොකරන තැනැත්තා නම් රහතුන් වහන්සේය. ''පුඤ්ඤපාප පහීණ'' යනු මේ තේරුමින් රහත් හට යෙදේ. පෘථග්ජනයාද දස කුසලයන් පුරා මරණින් මතු සුගතියෙහි උපදී.

❒ චූලකච්චන සූත්‍රයේදී බුදුරදුන් ඇසූ පැනයකට සච්චකයන් පිළිතුරු නොදී සිටිනු දක සක් දෙව් රජ බියකරු වෙසක් මවා ගෙන සච්චකයා බිය ගැන්වූ සැටි සඳහන් වෙයි. මේ වනාහී බුදන්ගේ

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

"ආනුභාවය" යටපත් වී දේවානුභාවය ඉස්මතු වී පෙනෙන තැනකි. මෙවැනි කියමන් "පුරිසදම්මසාරථී" යන උතුම් බුදු ගුණයට පහර වදින බව ඇතැමුන්ගේ හැඟීමයි. මෙය හරිද? වැරදිද?

මෙවැනි කියමන් කීපයක් අප පාලි සාහිත්‍යයෙහි දක්නට ලැබේ. ශක්‍රයා පින් බලාපොරොත්තුවෙන් සච්චකයන්ට ලැබෙන මහත් අර්ථය සලකා මෙවැනි කෘත්‍රිම දර්ශනයක් මවා පෑම බුද්ධානුභාවය යටපත් කිරීමක් නොව වෙය්‍යාවච්චමය කුසල කර්මයකි. මෙය රජ කෙනකුන්ට නොකළ හැකි සාමාන්‍ය "සුළු වැඩක්" රාජ පුරුෂයකු කළාත් මෙනි. එයින් රාජපුරුෂයා රජුගේ තත්ත්වය ඉක්මවීමකැයි කිව හැකිද?

මෙහි ලා අගේ ඇති කතාවක් සිහියට නැගේ. එකමත් එක රටක මහ මුදලි කෙනෙක් යාත්‍රාවක නැගී මුහුදේ ගියාලු. මුහුද මැද දී යාත්‍රාව සුළඟට හසුව ගලක හැපී සිදුරු වී එය තුළට දිය ඇතුළු වන්ට පටන් ගත්තාලු. යාත්‍රාවේ සිටිය මිනිහෙක් ඒ සිදුර වසාලන්ට තම අමුඩය කඩා ගුලි කර සිදුර වැසී විට මහමුදලි කීවාලු "උඹේ ලැජ්ජා නැතිකම මගේ මහමුදලිකමට වඩා ලොකු වුණා" කියා. එහෙත් ගොඩට ආපසු මුදලි කස්තානය ඔහුට දුන්නේ නැතිලු.

ඒ වගේ ශක්‍රයාගේ ක්‍රියාව ඒ සච්චක දමනයේදී පිහිට වුණාට ඔහුගේ ශක්‍ර භාවය බුද්ධානුභාවයට ඉහළින් ගියේ නැත. ඔබවහන්සේ කියන තර්කය මේ කරුණෙහි ලා ඉස්මතු වන්නේ නැත. එවැනි වැඩවලට දූන් ශක්‍රයා වැඩිපුර නොඑන්නේත් කාරණය ඔහුටද හොඳින් වැටහිලා වෙන්ට ඇති.



❐ කසීභාරද්වාජ බ්‍රාහ්මණයා බුදුරදුන්ට පිළිගැන්වූ දනය තමන් වහන්සේ නොවළඳා එයට කුමක් කරන්ට දැයි ඇසූ විට තණකොළ නැති තැනක හෝ සතුන් නැති ජලයෙහි බහන්ට කීමෙන් පෙනෙන්නේ ආහාර බුද්ධ පූජා අස්කිරීමේදී සතකුට වත් දීමට නුසුදුසුය යන්නද? එය පවක් විය හැකිද?

ඒ කසීභාරද්වාජයන්ගේ ආහාරය හුදු ශ්‍රද්ධාවෙන් නොව චාරිත්‍රයක් වශයෙන් පිරිනැමුණු නිසා බුදුරදුහු එය ප්‍රතික්ෂේප කළහ. එය අහක දමන්ට කීවේ ඒ නිසාමය. එය ඉන් පසු කාහටත් දිරවිය නොහැකි හෙයින් සතුන් නැති ජලයෙහි හෝ තණකොළ නැති තැනක දමන්ට නියම කළ සේක. ආහාර බුද්ධපූජා අස් කිරීමේදී එය වතාවත් කරන පුද්ගලයාට කැමැත්තක් කළ හැකිය. තමන්ම ප්‍රයෝජනයට ගැනීමේ හෝ කුසගිනි ඇති කා හට වුව හෝ දීමේ වරදක් නැත. ඔබ කියන පුවත විශේෂය. එය හැම තැනටම නොයෙදේ.

❐ ඇති දැඩි කරගත් සතකු මියගිය විට කෘතගුණ සැලකීමක් වශයෙන් පින්කම් කොට පින් දීම ආගමානුකූලද?

"යං කිඤ්චාර ම ණං කත්වා - දජ්ජා දනං අමච්ඡරි" යන න්‍යායයේ හැටියට එහි වරදක් නැත. ඕනෑම කරුණක් නිමිති කරගෙන දන් පින් කළ හැකිය යනු එහි තේරුමයි. බෝනික්කකු බිම වැටී බිඳී ගිය විටක පවා ළදරුවකු සැනසීමට දනක් දීමට බුදුරදුන් අනේපිඬු මහ සිටාණන්ට වදාළ බව අපේ බණ කතාවක දක්වේ. සතකු ගැන කියනු කවරේද?

❐ මනුෂ්‍ය ශරීරය වැඩීම හෝ විනාශ වීම පරමාණුන්ගේ භ්‍රමණය නිසා සිදුවන බව නවීන විද්‍යාව කියයි. එය බුදුදහමේ දක්වෙන ක්‍රමයට ගැළපේද?

අභිධර්මය සත්වයන් විග්‍රහ කිරීමේදී පරමාණුවක් ඔබ්බට යයි. පරමාණුවක් යනු රූපකාලපයන් සමූහයක් බව කියා රූප කලාපයකද සුද්දට්ඨ රූප හෙවත් වෙන් කළ නොහැකි වේය යන මතය බුද්ධ ධර්මය වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන කොටස් අටෙන් වෙනත් රූපයන්ගේ මිශ්‍රණයක් බව කියයි. එහෙයින් පරමාණු භ්‍රමණය මිනිස් සිරුර වැඩීම හෝ වැටීම වේය යන මතය බුද්ධ ධර්මය හා ඉඳුරා ගැළපෙන්නක් යි පිළිගැනීමට පෙරාතුව තවදුරටත් සොයා බැලිය යුතුය.

❐ භික්ෂු ශාසනය නිකායවලට බෙදුණේ කුමක් නිසාද? නිකායයන් අතර විනය නීති එකකට එකක් වෙනස් වන්නේද?

පළමුවෙන්ම භික්ෂු ශාසනය නිකාය වශයෙන් බෙදුණේ ධර්මවිනය සම්බන්ධයෙන් පැන නැගී මතභේද නිසාය. කොටස් 18 කට බෙදුණු නිකායයන්ගෙන් ස්ථවිරවාදී නිකාය ලංකාවේ පිහිටියේය. හෙද වළගම්බා රජු කල පෞද්ගලික වශයෙන් පන්සලක් පිළිගැනීමෙන් දෙකඩ වී මහා විහාරික අභයගිරික වශයෙන් බෙදී ගියේය. අභයගිරි නිකාය මහායානයට බර වීමෙන් සාගලික, වාජිරිය, ජේතවනකාදි විසින් බෙදී ගියේ ය. වර්තමාන භික්ෂු ශාසනය මහා විහාරික පරම්පරාවේම කොටස්ය. ලංකාවේ භික්ෂු ශාසනය නැතිවූ විට සියමෙන් හා බුරුමයෙන් උපසම්පදාව යළි ගෙන ඒම නිසා මහාවිහාරීය පරම්පරාවම සියම් අමරපුර (උඩ බුරුමය), රාමඤ්ඤ (පහත බුරුමය) යන නම්වලින් පෙනී සිටිතත් ඔවුන්ගේ විනය නීතිවල නම් වෙනසක් නැත.


**ධම්ම ගවේෂී**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."

# සෙංකඩගලට ඇසළ පෙරහරක් ඇයි..?

ඇසළ මාසයේ කෙරෙන ඇසළ පෙරහර අතර ඉහළම ස්ථානය ලැබෙනුයේ මහනුවර ශ්‍රී දළද මාලිගාවේ ඇසළ දළද පෙරහරටයි. කිත්සිරි මෙවන් රජු කල හේමමාලිය හා දන්ත කුමරු ලංකාවට වැඩම වූ බුදු හිමිගේ වම් යටි දළද හිමි සෙංකඩගල දළද මැඳුරේ පුද ලබයි. මධ්‍ය යුගයේ සිට සිංහල රජවරු රජකම තහවුරු කරගැනීමට දළද හිමි හා පාත්‍ර ධාතුව තම රජ මැඳුර අසලම තබා වන්දනාමාන කළහ. සීතාවක දෙල්ගමු විහාරයේ සිට සෙංකඩගලට දළද හිමි වැඩමවා ඇත. ඒ සෙංකඩගල මුලින්ම අගනුවර කරගත් පළමු විමලධර්මසූරිය රජු කලය. (ක්‍රි.ව. 1592-1604) රොබට් නොක්ස්ගේ විස්තරය අනුව උඩරට මුල් කල තිබී ඇත්තේ ඇසළ දේව පෙරහරකි. එය දළද පෙරහක් ලෙස සකස් කොට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සතර දේවාල ඉන්පසු පිළිවෙළින් පෙරහරේ යාම කීර්ති ශ්‍රී රාජසිංහ රජු කල ආරම්භ විය. සෙංකඩගල ඇසළ පෙරහර ආරම්භ වූයේ කෙසේදැයි අදහස් කීපයකි.

ඉන්දියාවේ සිට ලංකාවට ආ මුල් ආර්යයන් කෘෂිකර්මය ජීවනෝපාය කරගත් ගොවි පිරිසකි. වර්ෂාව, සූර්ය රශ්මිය, සශ්‍රීකත්වය මුල්කරගෙන දඹදිව පැවැති දූරාචාර අංග සහිත නැකත් කෙළිය මුල් කාලයේ ලංකාවේ තිබුණු බව මහාවංශයේ පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 377-307) පිළිබඳ විස්තරයෙන් පෙනෙයි. ගොවිතැනේ සශ්‍රීකත්වය පරමාර්ථයෙන් ඉටුකළ නැකත් කෙළියේ දූරාචාරිත ලක්ෂණ බුදු දහම ලංකාවට ආ පසුව යටපත්ව ඒ වාර්ෂික සශ්‍රීකත්ව උළෙලක් විය.



දළද හිමි ලංකාවට වැඩම වූ පසු දළද හිමිගේ ගෞරවය පිණිස පෙරහර පැවැත්වීම ආරම්භ විය. අනුරාධපුර මුල් කලම පැවැති දළද පෙරහර පිළිබඳ විස්තරයක් ක්‍රි.ව. 412 ලංකාවට ආ චීන ජාතික පාහියන් හිමි ප්‍රකාශ කරයි. ඉන්පසු රාජධානි, අගනුවරවල් වෙනස් වීම නිසා දළද පෙරහර පැවැත්වූ අගනුවරවල් වෙනස් විය. සෙංකඩගල අගනුවර වූයේ ක්‍රි.ව. 1592 පළමු විමලධර්මසූරිය රජු සෙංකඩගල අගනුවර පිහිට වූ පසුයි.


ඇසළ පෙරහරේ පරමාර්ථ කවරේදැයි දැන් කෙටියෙන් බලමු.

පාරම්පරික පිළිගැනීම් අනුව ඇසළ උද වනවිට ඉන්දියාවේ එද වර්ෂා සෘතුව උදවිය. නියඟයට පසු වර්ෂාවෙන් මැරී ගිය තණකොළ, ගස්වැල් පණ ලබා ලියලයි. කුඩා තණකොළ ගසට පවා ජීවයක් ඇති බව විශ්වාස කළ පැරණි දඹදිව බ්‍රාහ්මණ පරපුර දළුලා ලියලන තණකොළ පෑගීම පාපයක් ලෙස සැලකූහ. ඒ නිසා ලියලන තණකොළ නොපාගා වැහි තුන් මාසයේ එක තැනක වාසය කරන ලෙස බුදු හිමි භික්ෂූන්ට උපදෙස් දුන්නේය. ඇසළ සමය ඇරඹෙන වස් කාලය ඇරඹුණේ එසේ ඉන්දියාවේ තිබූ චාරිත්‍රය නිසාය.

එහෙත් පොසොන් පසුවී ඇසළ උදවන විට ලංකාවේ කාලගුණය උෂ්ණය, වියළිය, වර්ෂාව අඩුය. කෘෂිකර්මාන්තයෙන් යැපුණු ආදි ලාංකික සිංහල ජනයා මෙම ඇසල කාලයේ පවතින වියළි කාලයේ පවතින වර්ෂාව අපේක්ෂා කළහ. ඉර-හඳ, වැහි වළාකුළු, විදුලිය, මේඝය එද දේවත්වයෙන් පිදුවේ ඒවා ගොවිතැනට අවශ්‍ය වන සාධක බැවිනි. සීගිරි රූප, විදුලිය, හා



"දෙවූ වහාම කිරි නොම්දෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."



මේඝය බව පරණවිතාන මහතා කියයි. කළුවන් ළඳුන් මේඝයයි. රන්වන් ළඳුන් විදුලියයි. ඉසුරුමුණියේ මිනිසා හා අශ්ව හිස ඇත. ඒ අග්නි (ගින්දර, සූර්ය ශක්තිය) හා පර්ජනයයි. (විදුලිය) වෙයි. මේ අනුව ගොවිතැනට අවශ්‍ය සාධක දේවත්වයෙන් පිදීම එදා සිට සිදුවිය.

වියළි කාලවල වර්ෂාව පතා අනුරාධපුර තිසා වැවෙන් ජලය පෙරහරින් ගෙන ගොස් ජය ශ්‍රී මහා බෝධියට වත්කර වර්ෂාව පැතීම එදා සිට පැවැති බව 'ශාස්ත්‍රීය ලිපි හා කතා' ග්‍රන්ථයේදී චාල්ස් ගොඩකුඹුරේ පෙන්වා දෙයි.

ඇසළ මස පවත්වන ඇසළ උත්සව හා පෙරහරවල පොදු මූලික පරමාර්ථය ගොවිතැනට අවශ්‍ය වර්ෂාව ලබාගැනීම හා සශ්‍රීකත්වයයි. හැම ඇසළ උළෙලක්ම ආරම්භ වන්නේ කප් හිටුවීමෙනි. කප් හිටුවීමේදී කරනුයේ කොස් වැනි කිරි සහිත ගහක් කපා ඒ කැබලි කර දේවාල බිමේ සිටුවීමයි. කිරි සහිත ගස මංගල ලකුණකි.

පෙරහරේ සියලු ලක්ෂණ වර්ෂාව සංකේතවත් කරයි. හේවිසි, බෙර නාදය, අහස ගෙරවීම බඳුය. පෙරහරේ යන ඇත්තු වැහි වළාකුළු බඳුය. නැටුම්, ගැයුම්, වාදන ඝෝෂාකාරීය. පන්දම් එළි විදුලි කෙටීම වැනිය. හැම ඇසළ පෙරහරකම මේ පොදු ලක්ෂණ ගොවිතැනට අවශ්‍ය වර්ෂාව ලබාගැනීම, හිරුඑළිය, සශ්‍රීකත්වය මුල් පරමාර්ථ කොට ගෙන ඇත.

පෙරහර නිමවන්නේ දිය කැපීමෙනි. එය අසුරයන් පැරදවීම මූර්තිමත් කරන බව අදහස් කරයි. ගියවර දිය කපා පුරවා ගත් වතුර සෙම්බුව දිය කපන ස්ථානයට හලා කඩුවෙන් දිය දෙබෑ කොට අලුත් ජල සෙම්බුවක් පුරවාගෙන පෙරහරෙන් ආපසු එයි.

ඒ ජල සෙම්බුව අඩු නොවී පැවතීම නිසා සශ්‍රීකත්වය, ගොවිතැන් සරුවීම, හිතකර බව උදවන බැව් විශ්වාසයයි. දිය කැපීමෙන් අදහස් කරන්නේ වර්ෂාව ලබාගැනීමට තිබූ පැරණි හින්දු කතාවල එන බාධක සිඳ බිඳ නියමිත කාලයට වර්ෂාව ලබාගැනීම සංකේතවත් කිරීම බව චාර්ල්ස් ගොඩකුඹුරේ ඉහත දැක්වූ ග්‍රන්ථයේදී පෙන්වා දෙයි.

දිය කපන විට මුලින් දේවාලයේ සිට වූ කප කැබලි කර දියට දමයි. පැරණි ජල සෙම්බුව ගඟට හලයි. ඉවත ලූ කපේ කොටස් ලබාගැනීමට මහවැලි ගඟේ ගැටඹේ තොටුපළේදී මිනිස්සු පොර කති. කපේ කොටස් ගොඩ හා මඩ ඉඩම්වලට දැමීමෙන් කෘමි රෝග නැතුව ගොවිතැන සශ්‍රීක වන බව ඔවුන්ගේ පිළිගැනීමයි.

දිය කැපූ විගස දිය කැපූ ස්ථානයේ ගිලී නෑමෙන් ලෙඩ රෝග දුරු වී නිරෝගී සුවය ලැබෙන බව විශ්වාසයයි. ඒ නිසා ගැටඹේ තොටුපළේ දිය කැපීම සඳහා එහි දහස් ගණනක් රැස්වෙති.


දළඳ පෙරහරෙන් ලෙඩ රෝග දුරුවීම, අපල දුරුවීම, ශාන්තිය උදවන බව පිළිගැනෙයි. විශේෂයෙන් මුල් කුඹල් පෙරහර කුඩා දරුවන්ගේ සියලු දෙස් දුරලා රැකවරණය සලසන බව විශ්වාසයයි.


දේව පෙරහරවල් තුළින් ග්‍රහ දෝෂ, අපල දුරුවී දේව පිහිට ලැබෙන බව විශ්වාසයයි.

පෙරහර නිමවූ පසු මහනුවර විෂ්ණු දේවාලයේ පැවැත්වෙන හද්දෑ වළි යකුන් නැටීම, පෙරහර පැවැත්වීමේදී සිදුවූ අත්වැරදි දුරලීම, දෙවියන්ට පින් පැමිණවීම, දේව ආශිර්වාදය ලබාගැනීම ආදියද සිදුවෙයි.

**එස්. කේ. ජයවර්ධන**

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."



# සසර දුකින් මිදීමට නම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධකොට නිවන් දැකිය යුතුමයි

දේශකයාණෝ : ශ්‍යාමෝපාලි
මහානිකායේ මල්වතු මහාවිහාර
පාර්ශ්වයේ විංශද්වර්ගික
කාරක සංඝ සභික
**පූජ්‍ය තිබ්බටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ මේධංකර**
තේවාවහාර නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"චත්තාරිමානි භික්ඛවෙ අරියසච්චානි. කතමානි චත්තාරි? දුක්ඛං අරියසච්චං, දුක්ඛ සමුදයං අරියසච්චං, දුක්ඛ නිරෝධං අරියසච්චං, දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා අරියසච්චං."

"මහණෙනි, ආර්ය සත්‍ය සතරකි. ඒ සතර නම් දුක්ඛ ආර්ය සත්‍යය (දුක), දුක්ඛ සමුදය ආර්ය සත්‍යය (දුක ඉපදීමට හේතුව), දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (දුක ඉපදීමට හේතුව නැති කිරීම), දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදා ආර්ය සත්‍යය (දුක ඉපදීමට හේතුව නැති කිරීමේ මාර්ගය) යනුයි."

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

පින්වත්නි,

බෞද්ධයන්ගේ පරම පැතුම අජරාමර නිවනට පැමිණීමයි. යළි උපතක් නැති නිවන පරම සැපයයි. පරම විමුක්තියයි. ඒ සඳහා ප්‍රඥාවන්ත මිනිසා විසින් සිදු කළ යුත්තේ බුද්ධිය මෙහෙයවා දුකෙන් ගැලවීමට සිත දියුණු කර කුසල් දහම්හි හැසිරීමයි. සිත දමනය කරගත්, පිරිසිදු කරගත් මිනිසාට නිවන්මග හෙළි වේ. සදාකාලික සැනසිල්ල ලබාගැනීමට නම්, සසර දුකින් නිදහස් වීමට නම්, අජරාමර නිවන්මග පසක් කරගත යුතුමය. ඒ සඳහා දුක, දුක හටගැනීමට හේතුව, දුකට හේතුව නැති කිරීම, දුකින් මිදීමේ මාර්ගය යන මෙම සත්‍යය සතර මනාව අවබෝධ කරගත යුතු බව බුද්ධානුශාසනාවයි.

ලොව්තුරා බුද්ධත්වයට පත් අප බුදුරජාණන් වහන්සේ සත්සතිය ගෙවා අජපල් නුගරුක වැඩසිට, තමන්වහන්සේ අවබෝධ කරගත් චතුරාර්ය සත්‍ය ධර්මය ඉතා ගැඹුරු බැවින්, තෘෂ්ණාවෙන් දැවටුණු, මෝහයෙන් පිරුණු සාමාන්‍ය ලෝවැසියාට අවබෝධ කිරීම දුෂ්කර බව සිතත්ම, සහම්පති නම් මහාබ්‍රහ්මයා එහි අවුත් කළ ඇරයුම පරිදි බුදුඇස යොමු කොට බලා කවරෙකුට පළමු දම්දෙසුම කළ යුතුදැයි සිතූ සේක. ප්‍රථම ධර්ම දේශනාව කළ යුත්තේ කවරෙකුටදැයි විමසා බලද්දී ධර්මය සොයා යන ගමනේදී තමන් වහන්සේට උපකාරී වූ ආලාරකාලාම සහ උද්දකරාමපුත්ත යන අය ගැන පළමුව සිහිපත් වූ නමුදු ඔවුන් ජීවතුන් අතර නැති බව දැන අනතුරුව, සය වසක දුෂ්කර ක්‍රියා සමයේදී උපකාරී වූ කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන් බරණැස ඉසිපතනයේ මිගදායේ සිටින බව දැන, ඔවුන් සොයා එහි වැඩම කළ සේක. ඇසළ මස තුදුස්වක දා අළුයම බරණැස ඉසිපතනය කරා නික්මී සවස් භාගයෙහි බරණැස ඉසිපතනයට ළඟා වූ සේක.

බුදුරජාණන් වහන්සේ වැඩම කරන ආකාරය ඈත සිටම දුටු පස්වග තවුසන් "ශ්‍රමණ භවත් ගෞතම තෙමේ වීර්යයෙන් මිදී කාමසුඛල්ලිකානුගෝගීව සිට දැන් අප කරා එයි." පෙර ගමන් නොකිරීමටත්, නොවැඳීමටත්, උවටැන් නොකිරීමටත් කතිකා කොට කැමතිනම් අසුන් ගැනීමට අසුනක් පැනවූහ. එහෙත් ළංවත්ම, එම කතිකාවෙහි පිහිටීමට නොහැකිව පෙර ගමන් කොට පාසිවුරු ගෙන මුවදෝනා පැන් තැබූහ. කෙනෙක් අසුන් පැනවූහ. වැඳුම් පිදුම් ආදී ආචාර කළහ. පසුව බුදු නොවූ බව සිතා "ඇවැත්නි" යනුවෙන් ඇමතූහ. එවිට තථාගතයන් වහන්සේ, තමන්වහන්සේ බුදුබව ලැබූ බව කරුණු සහිතව වදාළ සේක. එදින සන්ධ්‍යා කාලයේ සඳ උදාවත්ම බණ අසනු රිසින් දෙව්බඹහු ද ඉසිපතනයට රැස්වූහ. තථාගතයන් වහන්සේ මිහිරි හඬින් පස්වග තවුසන් අමතා,

**"ද්වෙ'මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බාඃ යො චා'යං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො, හීනො, ගම්මො, පොථුජ්ජනිකො, අනරියො, අනත්ථසංහිතොඃ යොචා'යං අත්තකිලමථානුයොගො, දුක්ඛො, අනරියො, අනත්ථසංහිතො."**

"මහණෙනි, සසර දුකින් මිදෙනු පිණිස පැවිද්දෙකු විසින් නොසෙවිය යුතු අන්ත දෙකෙකි. ඒ දෙක නම් කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගයයි." ඒ අනුව අනාර්ය වූ ළාමක වූ ග්‍රාම්‍ය වූ පංචකාමයේ ඇලීම නම් වූ කාමසුඛල්ලිකානුයෝගය සහ අනාර්ය වූ දැඩි වූ දුක් උපදවන ශරීරයට දුක් පීඩා දීමාදියෙහි ඇලීම නම් වූ අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකෙන් මිදී මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපැදීමෙන් කෙලෙසුන් නසා සත්‍යාවබෝධය හා නිර්වාණය ලද හැකිවේ.


චතුරාර්ය සත්‍යයෙහි (ඇත්ත සතරෙහි) පළමු වැන්න වනාහි දුක්ඛ සත්‍යයි. දුක යනු ජාති (ඉපදීම), ජරාව (ශරීරයාගේ දිරීම), මරණය (නාමරූපයන්ගේ බිඳීම), ශෝකය (ප්‍රිය වස්තු, ප්‍රිය පුද්ගල හානිය, විනාශය), පරිදේව (නෑසියන් ආදීන් වැනසී හැඬීම, වැළපීම), දුක්ඛ (ශරීරයේ හටගන්නා වේදනාව), දොම්නස (සිතෙහි හටගන්නා දුක), උපායාසය (සිතෙහි හටගන්නා බලවත් වෙහෙස, ආයාසය), පියේහි විප්පයෝගෝ දුක්ඛො (ප්‍රියයන්ගෙන් වෙන්වීම, ආදරය කරන අයගෙන් හා දැයෙන් වෙන්වීම), අප්පියේහි සම්පයෝගෝ දුක්ඛො (අප්‍රිය පුද්ගලයන්, වස්තු හා ද්‍රව්‍ය දැකීම, එක්වීම, කැමති දේ නොලැබීම, ලැබීමට බලාපොරොත්තු වන දේ නොලැබී යාම), පංචූපාදන්කන්ධා දුක්ඛා. (රූප වේදනා සංඥා සංස්කාර විඤ්ඤාණ යන ස්කන්ධ පහම දුකය).

දුක්ඛ සමුදය සත්‍යය යනු, දුකට හේතුව වූ කාම, භව, විභව යන ත්‍රිවිධාකාර තෘෂ්ණාව හෙවත් ඇල්මය. කාම තණ්හා යනු පංචකාමයේ ඇලෙන තෘෂ්ණාවයි. (කිසිම දෘෂ්ටියක නොබැඳී මෙලොව සැප විඳිය යුතුය යන හැඟීමයි.) භව තණ්හා යනු මේ සැප කිසි දිනෙක නැති නොවන්නේ යැයි සිතා සැප විඳීමයි. (ශාස්වත දෘෂ්ටි සහගතව හටගන්නා තෘෂ්ණාව.) විභව තණ්හා යනු උච්ඡේද දෘෂ්ටි සහගතව හටගන්නා තෘෂ්ණාවයි. දුක්ඛ නිරෝධ යනු, දුක ඉපදීමට හේතු වූ තෘෂ්ණාවේ නිරෝධයයි. නසාලීමයි. දුරු කිරීමයි. දුක්ඛ නිරෝධ මාර්ග සත්‍යය යනු, දුක්ඛ නිරෝධය හෙවත් නිර්වාණයට පැමිණීමේ මාර්ග යයි. තෘෂ්ණාව නසන, තෘෂ්ණාවේ මුල් සිඳ දමන ධර්මය, ක්‍රමය දුක්ඛනිරෝධගාමිණී පටිපදාවයි. මාර්ගයයි. නිවනට පැමිණෙන නොවරදින මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. දුකින් මිදීමේ මාර්ගය වන්නේ සම්මා දිට්ඨි (නිවැරදි දැකීම), සම්මා සංකප්ප (නිවැරදි සිතුවිලි), සම්මා වාචා (නිවැරදි වචනය), සම්මා කම්මන්ත (නිවැරදි ක්‍රියාව), සම්මා ආජීව (නිවැරදි ආජීවය), සම්මා වායාම (නිවැරදි වෑයම), සම්මා සති (නිවැරදි සිහිය), සම්මා සමාධි (නිවැරදි සමාධිය) යන අට මගයි.

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."

දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන සත්‍ය සතර තිපරිවට්ට ද්වාදසාකාරයි. එහි තුන් පැවැත්මක් හා ආකාර දොළසක් ඇත.

01. දුක්ඛ
1. සත්‍ය (සත්‍යක් ලෙස අවබෝධ කර ගැනීම.)
2. කෘත්‍ය (කළ යුත්තක් බව - පිරිසිඳ දතයුත්තක් බව)
3. කෘත (කරන ලද - පිළිසිඳ දන්නා ලද බව)



02. සමුදය
1. සත්‍ය (සමස්ත ලෝකයම මැනවින් හටගැනීම පිළිබඳ මනා දැක්ම)
2. කෘත්‍ය (තෘෂ්ණාව ප්‍රහීණ කළ යුත්තක් බව)
3. කෘත (ප්‍රහීණ කළ බව)

03. නිරෝධ
1. සත්‍ය (මූලික අවබෝධය)
2. කෘත්‍ය (සාක්ෂාත් කරගත යුත්තක් බව - ප්‍රත්‍යක්ෂ කොට දත යුතු බව)
3. කෘත (සාක්ෂාත් කර ගන්නා ලද)

04. මාර්ග
1. සත්‍ය (සත්‍යයක් ලෙස දැකීම)
2. කෘත්‍ය (වැඩිය යුත්තක් සේ දැකීම - භාවේතබ්බ)
3. කෘත (වඩන ලද බව - භාවිත) යනුවෙනි.


මෙසේ ආර්ය සත්‍ය සතර කෙරෙහි තත්ත්වාබෝධ ඥාණය ලබාගන්නා ආකාර දැක්වෙන ධම්මචක්කපවත්තන සූත්‍රදේශනාව ශ්‍රවණය කිරීමෙන් පසු පස්වග තවුසෝ බලවත් සතුටට පත්වූහ. දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද මහහඬින් සාදුනාද දුන්හ. මහපොළොව කම්පා විය. මෙසේ දේශනා කරන ලද ගාම්භීර වූ ධර්මය පළමුව දැනගත් කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් ඵලයට පැමිණ පැවිදි උපසම්පදාව ලැබුවේය. තථාගතයන් වහන්සේ, කොණ්ඩඤ්ඤ තවුසා හැමට පළමු චතුරාර්ය සත්‍යය ධර්මය ඒකාන්තයෙන්ම දැනගත්තේයැයි උදම් ඇනූ සේක. ඒ නිසාම කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ නමින් ප්‍රකට විය. අනතුරුව ආයුෂ්මත් වප්ප, භද්දිය යන දෙනම ද, අවසානයේ ආයුෂ්මත් මහානාම, අස්සජි යන දෙනම ද සෝවාන්ව මහණ උපසම්පදාව ලැබූහ. සෝවාන් වූ පස්වග මහණුන් එක් කොට දේශනා කරන ලද, අනත්තලක්ඛණ සූත්‍රය නම් වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම විස්තර කෙරෙන දේශනාව ශ්‍රවණය කොට රහත් ඵලයට පැමිණියහ. මෙසේ අප මහාබුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනයේ දී වෙනයම් කිසිවෙකුට හෝ නොපැවැත්විය හැකි ධම්මචක්ක දේශනාව පවත්වන ලදී. මෙම චතුරාර්ය සත්‍ය ධර්මය මැනවින් දැන උගෙන, අවබෝධ කොට ගෙන අපිදු සසර දුකින් මිදීමට අදිටන් කර ගනිමු. තෙරුවන් සරණයි.


''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

# පුරාණ ශ්‍රී ලංකාවේ ආගමික යුද්ධ

ලෝකයේ පුරාණයේ සිටම අද දක්වාම යුද්ධ කලකෝලාහල ඇතිවී තිබෙන්නේ රට ජාතිය මුල්කොටගෙන පමණක් නොවේ. ආගම් නිසා ඇති වූ යුද්ධද අපමණය. මධ්‍යකාලීන අවධියේ යුරෝපයේ ඇතිවූ කුරුස යුද්ධ මීට හොඳ උදාහරණයකි. ශ්‍රී ලංකාවේද බුදු දහම හා සංඝ සංස්ථාව ස්ථාපිත වීමෙන් අනතුරුව ඊට විරුද්ධව ඉතා තදින් බලවේග ක්‍රියාත්මක වූ අවස්ථා කීපයක්ම ඉතිහාසයේ දක්නට ලැබේ. එහි පළමු අවස්ථාව උදා වූයේ බුද්ධාගම හා සංඝ සංස්ථාව මෙරට ස්ථාපිත මුල්ම වකවානුවේදීය. දෙවනුව අනුරාධපුර යුගයේ අවසානයත්, වීර ශෛව නිකායික මාඝගේ ආක්‍රමණය මෙන්ම පරංගීන් ඇතුළු යුරෝපීයන්ගේ ආක්‍රමණික අවස්ථා දැක්විය හැකිය. මෙම මාතෘකාවේදී පළමුවෙන්ම අප විසින් මෙහි පසුබිම විමසා බැලිය යුතුය. ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ සංඝ සංස්ථාව මෙරට ස්ථාපිත වන විට උත්තර භාරතයේ පැවැති ජෛන, නිගණ්ඨ හා බ්‍රාහ්මණ ආගම් මෙහි ඉතා හොඳින් ස්ථාපිතව ක්‍රියාත්මක වූ බවට සාක්ෂ්‍ය ඇත. නිදසුන් වශයෙන් ක්‍රි.පූ. 4 වැනි සියවසේ පණ්ඩුකාභය සමයේ ගිරි නිගණ්ඨ මූලස්ථානය ඇතුළුව පැවැති ඉහත කී ආගමික මධ්‍යස්ථාන පිළිබඳව මහාවංසය, බෝධිවංස ගැටපදය, වංසත්ථප්පකාසිනිය ආදියේ දැක්වෙන විස්තර පෙන්විය හැකිය. එහෙත් මිහිඳු හිමියන් මෙහි පැමිණීමත් සමගම රජතුමාත්, අමාත්‍යවරුන් ඇතුළු ප්‍රධානීන් සියලු දෙනාත් සිය පරිවාර ජනයා සමග බුද්ධාගම වැළඳගෙන ඊට අනුග්‍රහ දැක්වීමට පටන් ගනිත්ම අනුරාධපුරයේ පමණක් නොව රට පුරා සිටි ජනයා බුද්ධාගම වටා රොක්වූ බව සනාථ වන්නේ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් රටපුරා ඇති බ්‍රාහ්මී සෙල්ලිපි නිසාය. එම සෙල්ලිපි ඇති ලෙන් ප්‍රදේශවාසීන් විසින් තම භික්ෂූන් වහන්සේලාට සකස් කර දුන් ඒවාය.

මෙසේ බුද්ධාගම නැගී ඒමත් සමගම තම වරප්‍රසාද අහිමි වූ බ්‍රාහ්මණ, ජෛන ආදී පූජකයන් බෞද්ධ පාලකයකු වෙනුවට තම තමන්ගේ ආගම අදහන පාලකයකු රජ කරවීමට ගත් උත්සාහයන් ක්‍රිස්තු පූර්ව යුගයේ මෙරට පැවැති දේශපාලන අරගල මෙන්ම සටන් මාලාවේ යටින් විහිදී ගිය තේමාව බව එම සටන් හා ඊට පසුබිම හා ප්‍රතිඵලද, ක්‍රියාකාරීත්වයන්ද පිළිබඳව





සාම්ප්‍රදායික දෘෂ්ටිකෝණයෙන් බැහැර වී විමර්ශනය කිරීමෙන් අනාවරණය කරගත හැකිය. මහාවංසය දක්වන පරිදි දේවානම්පිය තිස්ස හා උත්තිය යන පාලකයන්ගේ පාලනය යටතේ ඇතිවූ බෞද්ධ ප්‍රබෝධයත් සමගම සොළී රටින් එළාර පැමිණ අසේල රජු පලවා හැර වසර 44 ක් රාජ්‍ය කර ඇත. මේ පිළිබඳව මහාවංසයද, මහාවංස ටීකාවද දක්වන්නේ එළාර බෞද්ධයකු නොවන බවය. මිථ්‍යා දෘෂ්ටිකයකු වන බවය. ඒ හැර එළාර පිළිබඳව කිසිදු දෝෂාරෝපණයක් නොකරනවා පමණක් නොව ඔහු ධාර්මිෂ්ඨ පාලකයකු බව ගාථා 20 කින් පුන පුනා පෙන්වා දෙයි. මෙපුවත අප තවදුරටත් සම්බන්ධ කළ යුත්තේ එළාරට විරුද්ධව සටන් මෙහෙයවන දුටුගැමුණු පවසා ඇත්තේ තමාගේ ඒ ව්‍යායාමය රජ සැප පිණිස නොව බුදු සසුන රැකගැනීම සඳහා පමණමය. එසේම සටනින් ජයගත් දුටුගැමුණු එළාර වෙනුවෙන් ඔහු මියගිය ස්ථානයේ චෛත්‍යයක් කරවා එතැනින් පෙරහර ආදිය ගමන් කරන කල්හි ශබ්ද නොකළ යුතු බවට ආඥා පැනවීමෙන් පැහැදිලි වන්නේ එළාර ජනාදරය දිනා සිටි අබෞද්ධ පාලකයකු බවය. එළාර යටතේ සිංහල ප්‍රධානීන් ඇමැතිවරුන් මෙන් සේවය කළා පමණක් නොව සිංහලයන් බොහෝ පිරිසක් ඔහුගේ හමුදා භටයන් වී ඇත. දුටුගැමුණු රජුගේ සටන් පෙරමුණේ භික්ෂූන් වහන්සේලා වැඩම කළ බව අපේ සියලු වංසකථා පවසයි. එය බුදුදහම රැකගැනීම සඳහා කෙරෙන සටනකට සිංහලයන්ගේත්, බෞද්ධයන්ගේත් ආකර්ශනය ලබාගැනීමක් සඳහා වූ බව පෙනේ. දුටුගැමුණු රාජ්‍යයට පත්වීමෙන් පසු සිදුකෙරෙන මුල්ම කාර්යයන් අතර ප්‍රධාන වන්නේ බුද්ධාගමේ සංවර්ධනය සඳහා කෙරුණ දැවැන්ත වැඩපිළිවෙළය. මිරිසවැටිය, රුවන්වැලිසෑය, ලෝවාමහාපාය ආදී මහා කර්මාන්තයන් කිරීමෙන් මෙම යුගය ලංකාවේ බෞද්ධ ඉතිහාසයේ කැපී පෙනෙන යුගය බවට පත්ව ඇත.

මෙලෙස බුදු සමය නැවත නැගී සිටිමින් ප්‍රබල තත්ත්වයකට පත්වන විට අබෞද්ධ පූජක පිරිස් හා ඔවුන්ගේ අනුශාසනය ලද්දා වූ අන්‍යාගමික ලබ්ධිකයන් නිශ්ශබ්දව සිටිනවාට වඩා මහත් සේ සංවිධානය වී බෞද්ධ පාලකයන් රටේ නායකත්වය ගනිමින් දේශපාලන බලය ලබාගන්නවාට විරුද්ධව පෙළ ගැසීමක් දක්නට ලැබේ. ක්‍රිස්තු පූර්ව පළමු ශතකයේ අවසාන කාලයේ වළගම්බා රජු සමයේදී අපට දක්නට ලැබෙන්නේ එම නැගී සිටීමේ උච්ඡතම අවස්ථාවයි.

රුහුණේ සිටි එක්තරා බ්‍රාහ්මණ වංශික තරුණයකු බ්‍රාහ්මණ පූජකයකුගේ උපදෙස් පරිදි වළගම්බා රජතුමාට විරුද්ධව කැරළි ගැසීම මේ අතර ප්‍රධාන වේ. ඒත් සමගම දකුණු ඉන්දියාවේ සිට සේනාව සමග දෙමළ ප්‍රධානීන් සත්දෙනකු නැව් නැගී මෙරටට පැමිණ අනුරාධපුරය ආක්‍රමණය කොට බලය ලබාගන්නා ලදී. මේ ක්‍රියාදාමයන් දෙක වෙන වෙනම සිද්ධීන් සේ පෙනුණද බෞද්ධ ප්‍රබෝධය නිසා වරප්‍රසාද අහිමි වූ අබෞද්ධ පූජක හා අනිකුත් පිරිස්වල සංවිධානාත්මක ක්‍රියාවලියක ප්‍රතිඵලයක් සේ සැලකිය හැකිය. නිදසුනක් වශයෙන් සතුරන්ගෙන් බේරී වළගම්බා රජතුමා පලා යාමේදී වඩාත් ප්‍රමෝදයට පත්ව ඇත්තේ නිගණ්ඨාගමේ මූලස්ථානයේ සිටි ප්‍රධාන පූජකයා වූ ගිරි නම් නිගණ්ඨයා වීම දැක්විය හැකිය. තීය හෙවත් තිස්ස නම් බ්‍රාහ්මණ තරුණයා විසින් ඇතිකළ රුහුණේ කැරැල්ල වුවද සම්පූර්ණයෙන්ම බෞද්ධ විරෝධී ක්‍රියාදාමයක් බව මනාව සනාථ වන්නේ

''වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න.''



අට්ඨකථා ඇතුළු සාහිත්‍ය කෘති කීපයකම රුහුණේ ඔහුගේ බලවත්වීම නිසා බෞද්ධ භික්ෂූන්ට මුහුණ පෑමට සිදුවූ දුඩි කරදර හා දුෂ්කරතා විස්තර වී ඇත. මේ නිසා බොහෝ භික්ෂූන් රට හැර දා නැව් නැගී ඉන්දියාවට පලා ගොස් ඇති බව මෙම ග්‍රන්ථවල සඳහන්ය. තීය හෙවත් තිස්ස පිළිබඳව සම්මෝහවිනෝදනී ආදී අට්ඨකථාවල හඳුන්වා ඇත්තේ චණ්ඩාලයා යනුවෙන් වීම මගින්ද මොහු පිළිබඳව භික්ෂූන් තුළ පැවැති විරුද්ධතාව සේම මොහු බුද්ධාගමට කෙතරම් සතුරු වන්නට ඇත්දැයි උපකල්පනය කළ හැකිය. මොහු කෙතරම් බලවත් වීද යත් භික්ෂූන් වහන්සේලා මොහු මැඩලීම සඳහා ශක්‍ර දෙවියන්ගෙන් උදව් ඉල්ලූ බවද එහෙත් ශක්‍ර දෙවියන්ගේ පිළිතුර වූයේ මොහු බොහෝ බලවත්ය, ඔබවහන්සේලා එතෙර යන්නේ නම් මහ සයුරේ ආරක්ෂාව සලස්වමියි යන්න බව අට්ඨකථාවල සඳහන් වී ඇත.

ඉපැරණි ග්‍රන්ථයක් වූ සීහලවත්ථුපකරණයේ මේ කාලය පිළිබඳව සඳහන් කථා ගණනාවකම දැක්වෙන්නේ ආහාර අහේනියට මුහුණ පා කරකොළ පවා වළඳමින් ජීවත් වූ භික්ෂූන් ගැනය. එසේම සම්මෝහවිනෝදනියේ දැක්වෙන පරිදි රුහුණේ සිතුල්පව් විහාරයේ වැඩ සිටි අතිවිශාල භික්ෂූන් සංඛ්‍යාවක් ආහාර නොමැතිකමින් මියගොස් ඇත. මේ තත්ත්වය යටතේ නැවත මේ අබෞද්ධ පාලකයන්ගෙන් බුදු දහම රැකගැනීම සඳහා වළගම්බා රජු ආරක්ෂා කොට සේනා රැස්කර දී ජනතා සහාය ලබාදීමට මූලික වන්නේද මහාතිස්ස නම් වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් වීම මෙහිදී සැලකිල්ලට ගත යුතු වෙනවා පමණක් නොව වළගම්බා රජතුමා බලය ලබාගත් විගසම ජෛන ආගමික මූලස්ථානය කඩා බිඳ දමා අභයගිරිය නමින් බෞද්ධ විහාරයක් ගොඩ නැගීමද මෙම අරගලයේ තවත් ඉතා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. වළගම්බා රජතුමා එහිදී අපේක්ෂා කරන්නට අනාගතයේ බුද්ධාගමට හා රජතුමාට අහිතකර මෙවැනි තත්ත්වයක් ඇති වුවහොත් ඊට විරුද්ධව රජුට සහය දෙමින් බුද්ධාගම රැකගැනීමට ඉදිරිපත් වන බෞද්ධ ආයතනයක අවශ්‍යතාව සපුරාලීම විය යුතුය. මින් පසු බුද්ධාගම මෙන්ම සංඝ ශාසනය මෙරට සුස්ථිර වූයෙන් අනුරාධපුර යුගය අවසන් වනතුරුම නැවත එවැනි සිද්ධීන් දක්නට නොලැබුණත් ක්‍රි.ව. 1017 දී රජරට සොළීන්ට යටත් වීමෙන් පසු වසර පණහක්ම බුද්ධාගමට අත්වූයේ එම ඉරණමමය. මහා විජයබා රජු මහා සංඝ රත්නයේ ආශිර්වාද මැද එම තත්ත්වය වැළැක්වුවද 1215 දී විරශෛව නිකායට අයත් විනාශකාරී මාඝ රජරට ආක්‍රමණය කොට බෞද්ධ ආරාම විනාශ කොට වටිනා ධර්ම ග්‍රන්ථ ගිනි තබා විනාශ කළේය. වන වැදී හෝ රට අතහැර ගිය භික්ෂූන් නැවත රැස්කරවා නැතිවූ රජරට වෙනුවට දඹදෙණියෙන් රාජ්‍යයක් ආරම්භ කොට බුද්ධාගම හා සංඝ සමාජය සුරක්ෂිත කළේ 1232 දී රජතැන් පත් 3 වන විජයබා රජතුමාය. ඊළඟට මෙවැනි විනාශයක් ඇති වූයේ 16 වැනි සියවසේ සිට මෙරටට සිදුවූ යුරෝපීය ආගමනයත් සමගය. පළමුවෙන්ම පැමිණි පරංගීන්ගේ අරමුණ එවුන් විසින්ම දක්වා ඇති පරිදි ක්‍රිස්තියානිය හා කුරුඳු සොයා ඔවුන් මෙරටට පැමිණි බවය. ඊට පෙර කිසිවකුට ඉටු කිරීමට බැරිවූ දෙයක් ඔවුන් විසින් ඉටු කරන ලදී. එනම් මෙරට සිංහල පාලකයකු බුදු දහම ඇදහීමෙන් ඉවත් කොට අන්‍යාගමකට, එනම් ක්‍රිස්තියානියට හරවා ගැනීමය. ඒ රට පාවා දුන් දොන් ජුවන් ධර්මපාලය.

**අනුෂී තිසාරා කාරියවසම්**

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."

# ප්‍රේත ලෝක දොළහ

1. සෙම සොටු ආහාර කොට ඇති වත්තාස නම් ප්‍රේත ලෝකය
2. මිනිසුන්ගේ හා සතුන්ගේ මළකුණු ආහාර කොට ඇති කුණපාස නම් ප්‍රේත ලෝකය
3. අසූචි ආහාර කොට ඇති ගුථබාදක නම් ප්‍රේත ලෝකය
4. කටින් නික්මෙන්නා වූ ගිනිදැල් ඇති අග්ගිජාල මුඛ නම් ප්‍රේත ලෝකය
5. ඉදිකටු මලකය පමණ වූ මුඛයක් ඇති මහා සැලියක් පමණ බඩ ඇති සුචිමුඛ ප්‍රේත ලෝකය
6. සාගින්නෙන් හා පිපාසයෙන් නිතර පෙළෙන බැවින් ආහාරපාන ආශාවෙන් පෙළෙන තණ්හාට්ටික ප්‍රේත ලෝකය
7. ගින්නේ දගිය කණුවක් මෙන් වියළී ගිය ශරීර ඇති සුනිජ්ඣමක ප්‍රේත ලෝකය
8. ආයුධ වැනි තියුණු තමාගේ ශරීරයම කැපෙන නිය ආදී ශරීර අවයව ඇති සත්ථංග ප්‍රේත ලෝකය
9. පරවත නම් විශාල ශරීර ඇති පබ්බතංග ප්‍රේත ලෝකය
10. පිඹුරන්ගේ ශරීර වැනි ශරීර ඇති අජහරංග ප්‍රේත ලෝකය
11. විමානවල ඉපිද සැප දුක් දෙකම කලින් කල විඳින්නා වූ වේමානික ප්‍රේත ලෝකය
12. කැලෑවල වාසය කරන්නා වූ මහත් වූ සෘධිද ඇති මහිංධික නම් ප්‍රේත ලෝකය

මෙහි ලෝකය යන්නෙන් අදහස් කළේ කොටස, වර්ගය යන බව දත යුතුය. තවත් මස්පිඩු වැනි ශරීර ඇති ප්‍රේතයෝ, ඇටසැකිළි බඳු ශරීර ඇති ප්‍රේතයෝ, කටින් දුගඳ හමන ප්‍රතිමුඛ ප්‍රේතයෝ ආදී බොහෝ ප්‍රේත කොටස් ඇත. ලක්ඛන හිමි මෙවැනි විවිධ ප්‍රේතයන් විසිඑක් දෙනකු දක ඇත. ප්‍රේත වස්තු ප්‍රකරණයේ ප්‍රේතයන්ගේ දුක්බර කථා පනස් එකක්ද දක්වා තිබේ.

ශාක්‍ය ඉඳුවර ගුණසේකර

# පටිසෝතාගාමී පුද්ගලයා හඳුනා ගනිමු

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනාවෙහි පුද්ගලයා හා පුද්ගල චරිත පිළිබඳව දීර්ඝ විවරණ ඇතුළත්ය. විභජ්ජවාදී සම්ප්‍රදය අනුගමනය කළ භාග්‍යවතුන් වහන්සේ ලෝකයේ විද්‍යමාන වන විවිධ වූ පුද්ගල චරිත යම් යම් නිර්ණායක යටතේ වර්ග කර දක්වූහ. එම පුද්ගල චරිත තුළින් විදහා දක්වෙන විවිධ වූ ලක්ෂණ පදනම් කර ගෙන මෙම වර්ග කිරීම සිදු කර ඇති බව පෙනේ. අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අන්තර්ගත අනුසෝත සූත්‍රය මේ ලෝකයේ ජීවත් වන පුද්ගල චරිත හතරක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරති. මෙහිදී අපට සමාජීය වශයෙන් වැදගත් වන අනුසෝතගාමී පුද්ගලයා හා පටිසෝතගාමී පුද්ගලයා පිළිබඳව සොයා බලමු.

ඒ අනුව පළමු පුද්ගලයා අනුසෝතගාමී පුද්ගලයායි. ඔහු පිළිබඳ දක්වීමේදී බුදුන් වහන්සේ විශේෂ වූ ලක්ෂණ දෙකක් පෙන්නුම් කර ඇත. එනම් කාමය පටිසේවනය සහ පාප කර්ම කිරීම යන ලක්ෂණ දෙකයි. කාමය පටිසේවනය යනුවෙන් දේශනාවේ පැහැදිලි කර ඇත්තේ පංචකාම වස්තූන් අවශ්‍යතාව ඉක්මවා පරිභෝජනය කිරීමයි.

මිනිසාගේ මූලික අවශ්‍යතා අතර ආහාර, වස්ත්‍ර, නිවාස හා බෙහෙත් ප්‍රධාන වෙයි. එයම පැවිදි පක්ෂය උදෙසාද සිව්පසය ලෙස බුදුන් වහන්සේ හඳුන්වා දුන්හ. ඒ අනුව ගිහි හෝ පැවිදි යම් පුද්ගලයෙක් මෙම අවශ්‍යතාවන් සීමාවන් ඉක්මවා පරිභෝජනය කරයි නම් ඔහු කාමය පටිසේවනය කරන පුද්ගලයකු ලෙස විග්‍රහ කර ඇත.



"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

කාමය යනු යම් යම් අරමුණු කෙරෙහි ඇතිවන සංකල්පමය කැමැත්තයි. එම කාමය ඉහත කී අවශ්‍යතාවන් සපුරා ගැනීමේදී පමණ ඉක්මවා ක්‍රියා කිරීම තුළින් පුද්ගලයා තුළ අනුසෝතගාමී ලක්ෂණ ඇති කරයි. එමෙන්ම සාධු සම්මත සමාජයේ පහත් දෙය සම්මත තමන්ටත්, අනුන්ටත් අවැඩදායක පාපී ක්‍රියා (දස අකුසල් පස් පව්) සිදු කිරීමද අනුසෝතගාමී පුද්ගලයාගේ ලක්ෂණයකි.

පටිසෝතගාමී පුද්ගලයා යනු අනුසෝතගාමී පුද්ගල චරිත ලක්ෂණවලින් හාත්පසින්ම වෙනස් වූ ලක්ෂණ පෙන්නුම් කරන පුද්ගල චරිතයකි. එනම් කාමය පටිසේවනය නොකරන පාපකර්මයන්ගෙන් වැළකුණු පුද්ගලයායි. මෙම පුද්ගල චරිතය පාපයෙන් වැළකී සිටීමට පමණක් සීමා නොවෙයි. පාපයෙන් වැළකී සිටි පමණින්ම එය යහපත් පුද්ගල චරිත ලක්ෂණයක් ලෙස බුදු දහම අවධාරණය නොකරයි. මෙහිදී පටිසෝතගාමී පුද්ගලයා බ්‍රහ්මචාරී පුද්ගලයකු ලෙස දක්වා ඇත්තේ ඒ නිසාවෙනි.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයන් යම් පුද්ගලයකුගේ කායකම්ම, වචීකම්ම, මනෝ කම්මයන් හරහා ක්‍රියාත්මක වන්නේ නම් එය බ්‍රහ්මචාරීත්වයයි. එනම් බ්‍රහ්ම චාරීත්වය යනු අබ්‍රහ්ම චරියාවෙන් වෙන්වීම (විරමණය) පමණක් නොවන බව පැහැදිලිය. පටිසෝතගාමී පුද්ගලයා තුළින් මෙත්තා, මුදිතා, කරුණා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයන් ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි මීළඟට විමසා බලමු.

මෙත්තා යනු මෛත්‍රිය හෙවත් හිතවත් භාවයයි. එය සමස්ත ලෝකය විෂයෙහිම පොදුවේ පැවතිය යුත්තකි. පළමුව හිතවත් භාවය දැක්විය යුත්තේ තමාටය. තමන්ට හිතවත් භාවය දක්වන පුද්ගලයා තුළ කිසිවිටෙකත් තමාට අහිතවත් වූ ලෝභාදී කෙලෙස් ධර්මතාවන් වැඩෙන්නේ නැත. ඒ නිසාවෙන් පළමුව තමාට මෛත්‍රීය දක්වා ආධ්‍යාත්මික පිරිසිදු භාවයක් ඇති කරගත යුතුය. පුද්ගලයා කේන්ද්‍ර කොට ගත් සමාජය පුද්ගල මනස මූලික කොට ගෙන (මනෝ මූලික) ගොඩ නැගෙන නිසාවෙන් පළමුව තමාට මෙත් වැඩීම වැදගත්ය. මෛත්‍රිය වඩන පුද්ගලයා අසරණයන්ට පිහිට වන ගහට කොළට පවා හිතවත් භාවය දක්වන පුද්ගලයෙකි. ඔහු කියන වචනත් සිදු කරන ක්‍රියාවනුත් යහපත උදෙසාම පවතියි.


කරුණා ගුණය ද ජීව අජීව සමස්ත ලෝකය කෙරෙහිම දැක්විය යුතු ගුණයකි. ''සියල්ලෝම දඬුවමට බිය වෙති. සියල්ලෝම මරණයට බිය වෙති. එහෙයින් තමා උපමා කරගෙන අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය.'' මෙම බුද්ධ දේශනාව අනුසාරයෙන් ගත් විට සියලුම සත්වයන් තමා සේ සලකා කටයුතු කිරීම වැදගත් සමාජ ධර්මතාවක් ලෙස හඳුනා ගත හැකි අතර එයම කරුණා ගුණය ලෙස දැක්විය හැකිය. එහෙයින් අනුන්ගේ යහපත වෙනුවෙන් තමාගේ යැයි සලකා පරාර්ථකාමී චේතනාවෙන් යුක්තව කටයුතු කළ යුතුය. එවිට කරුණා ගුණය පුද්ගලයා හරහා සමාජගත වෙයි.

සැපයට කවුරුත් ඇලුම් කරති. නමුත් කර්මානුරූපීව සැපය පුද්ගල භේදයකින් යුක්තව ක්‍රියාත්මක වෙයි. එමනිසා ඇතැමෙක් සැපය වෙනුවෙන් වෙහෙසෙන අතර ඇතැමුන්ට සැපය නිරායාසයෙන්ම ලැබෙයි. මෙම සමාජ විෂමතාවන් නිසා අනෙකාගේ සැපය දැක ඊර්ෂ්‍යාවෙන් පෙළෙන්නවුන් බොහෝයි. නමුත් එකිනෙකාගේ සැපය, දියුණුව කැමති බව හා ඒ සඳහා එකිනෙකා අතර අන්‍යෝන්‍ය සුහදත්වයකින් යුක්තව කටයුතු කිරීම මුදිතාවයි. දෙමව්පියන් දරුවන්ගේ සැපය අභිවෘද්ධිය වෙනුවෙන් කැපවී ක්‍රියා කරන අතර ඔවුන්ගේ සැපය අභිවෘද්ධිය දැක සතුටු වෙති. එලෙසම යම් කෙනකු අන්‍යයන්ගේ සැපය, අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කරන්නේද, අනෙකාගේ සැපය දැක සතුටු වන්නේද එය වනාහි මුදිතාවයි.

ලාභ-අලාභ, නින්ද-ප්‍රශංසා, සැප-දුක්, යස-අයස යන මෙම අටලෝ දහමින් කම්පා නොවී ලද දෙයින් සතුටු වන ස්වභාවය උපේක්ෂාවයි. එනම් වඩාත් බුද්ධිමත් භාවයෙන් හා සිහියෙන් යුක්තව ජීවත් වීමයි. මෙම උපේක්ෂා ගුණයෙන් තොර වූ සමාජය ඌන සමාජයකි. පුද්ගලයා සැමවිටම ඌන පුද්ගලයකු ලෙස තණ්හාවට දස වී ක්‍රියා කිරීම එහි ලක්ෂණයයි. තමා ලද දෙයින් තෘප්තිමත් නොවී නොලද දේවල් පසු පස අනවශ්‍ය ලෙස හඹා යෑම තුළින් සමාජ ප්‍රශ්නද ගොඩනැගෙයි. එහෙයින් උපේක්ෂාව යනු අනෙක් බ්‍රහ්ම විහරණ මෙන්ම සමාජය තුළ ඉතාමත් ඵලදායී ලෙස දියුණු කළ හැකි ගුණයකි.

අනුසෝතගාමී පුද්ගලයා සතු ලක්ෂණ අනාර්ය භාවයට හේතු වන අතර පටිසෝතගාමී පුද්ගලයා සතු ලක්ෂණ ආර්ය භාවයට හේතු වෙයි. ඒ අනුව සාංසාරික සත්වයා අනාර්ය භාවයෙන් ආර්යභාවයට පත්කරලන පරිවර්තනීය ලක්ෂණයන්ගෙන් හෙබි පුද්ගලයා පටිසෝතගාමී පුද්ගලයා ලෙස හඳුනා ගත හැකිය.

**පූජ්‍ය ඕපනායක ධීරානන්ද හිමි**



''යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''


මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## වැරදි පිළිගැනීමට මැලි නොවෙමු

ප්‍රභූදුන් මනුෂ්‍යයන් තුළ වැරදි ඇතිවීම ස්වභාවයකි. තමන් තුළ තිබෙන වැරදි තමන්ට පෙනෙන්නේ නැත්නම් අනෙකකු තමන් තුළ තිබෙන වැරදි පෙන්වා දිය යුතුය. වැරදි යන මේ සිංහල වචනයට පාලි භාෂාවෙන් පවසන්නේ "වජ්ජ" යනුවෙනි. එය විග්‍රහ කරන්නේ "වදිතබ්බං වජ්ජං" යනුවෙනි. කිවයුතු නිසා වජ්ජ නම් විය. මේ අනුව වරදක් නම් කිව යුතුමය. පෙන්නා දිය යුතුමය. යමෙක් යමකුට වරද පෙන්නා දේ නම් වරද සහිත පුද්ගලයා ඒ තමන්ට වරද පෙන්නා දෙන පුද්ගලයාට ගරු බුහුමන් කරමින් ඇසුරු කළ යුත්තේ කෙසේදැයි පවසනවා නම් දුගියකුට මහා නිධානයක් පෙන්වා දෙන්නකු ඒ දුගියා තමන්ට මහා නිධානයක් පෙන්නා දුන් පුද්ගලයා ඇසුරු කරන්නාක් මෙනැයි දේශනා කොට වදළේ "නිධීනංව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං" යනාදී වශයෙනි.

තමන්ට තමන්ගේ වැරදි පෙන්නා දෙන්නා වූ තැනැත්තා පිළිබඳ තරාතිරමක් සැලකිය යුතු නොවේ. එයට හොඳ නිදර්ශනයක් නම් සැරියුත් මාහිමිපාණන් වහන්සේ පොරවාගෙන සිටි සිවුරෙහි කොනක් දික්වී තිබෙනු දුටු සත් හැවිරිදි සාමණේර නමක් ඒ බව කියා සිටි විට, සැරියුත් මාහිමිපාණන් වහන්සේ සිවුර මැනැවින් පොරවාගෙන උක්කුටිකයෙන් හිඳ "තදහු පබ්බජිතො සන්තො ජාතියා සත්තවස්සිතකා සොපි මං අනුසාසෙය්‍ය, සම්පටිච්ඡාමි මුද්ධනා" යනුවෙන් එදවස පැවිදි වූ සත්හැවිරිදි සාමණේර නමක් වුව, මට අනුශාසනා කරනවා නම්, ඒ අනුශාසනාව මා හිස මුදුණින්ම පිළිගන්නවා" යයි කීහ. මේ පුවත අනුව තමන් තුළ යම් වරදක්, අඩුපාඩුවක් තිබෙනවා නම්, එය තමන්ට පෙන්වා දෙන පුද්ගලයා පිළිබඳ උසස් පහත් තත්ත්වයන් ගැන සැලකිලිමත් නොවිය යුතු බව වටහා ගත යුතු ය. යමකු තුළ මොනවා හෝ තිබෙනවා නම් ඒවා දැක දැක නිහඬ නොවිය යුතු බව බුදු දහමෙහි පැහැදිලි කොට තිබෙන්නේ "ඔවුනොවුන්ගේ දුටු වරද කීමෙන් මෙත්තාවාචී කර්මය පුරා" යන වශයෙනි. අනුන් තුළ තිබෙන වරද පෙන්නා දීම මෛත්‍රී වාක්කර්මය බව ප්‍රකාශ වන බැවින් එය පුණ්‍ය කර්මයකැයි තේරුම් ගත යුතුය. තමන්ට පෙන්නුම් කර දෙන්නා වූ තමන් තුළ පවත්නා අඩුපාඩු තේරුම් ගෙන මතු එම වැරදිවල නොයෙදෙමියි ඉටා ගැනීම උතුම් මහත්මා ගතියකි.

"දළඳ වරුණ" කියවන ඔබත් මේ කරුණ සිත්හි ධාරණය කොටගෙන, ධර්මානුකූලව ජීවත් වෙමින් මෙලොව පරලොව ජීවිතය සාර්ථක කරගැනීමට උත්සාහ කළ යුතුය. ■




එය හිස් අවකාශයක් නොවේ. ස්වභාව සුන්දරත්වයෙන් අනූන වූ, ඒ සුන්දරත්වයට ඓතිහාසික වටිනාකමක් එක්කළ, ඒ ඓතිහාසික වටිනාකමට පූජනීයත්වයක් එක්කළ, ඒ පූජනීයත්වය නිසාම බෞද්ධ ජනතාවට වන්දනාමාන කිරීමට අවැසි පවිත්‍ර වූ බිමක් ලෙස සැකසුණු පුදබිමක් නොහොත් ආරණ්‍ය සේනාසනයකි. යක්කල, රදවාන පාරේ අඹගස්පිටියේ සැතපුම් තුනේ කණුව අසලින් වැටී ඇති මග දිගේ තවත් කි.මී. දෙකහමාරක් පමණ පැමිණ මේ පුද බිම වෙතට පැමිණිය හැකිය.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මල්වතු හිරිපිටිය පස්ගම්මන යොන්ගම්මුල්ල අඹපිටිය සහ කඳුමුල්ල යන ග්‍රාමයනට මැදිව පුරාණ උෟරුවල මාවත ආසන්නයේ මුහුදු මට්ටමේ සිට අඩි අටසියයක් පමණ උස්වූ මෙම පර්වත භූමිය අදත් වහරන්නේ මාළිගාතැන්න යන ප්‍රකට නාමයෙනි.

අක්කර සිය ගණනක් පුරා විහිදෙන කඳු මේබලාවක මත ගොඩ නැගී ඇති මාළිගාතැන්න වෙත නැගීමට පාදමේ සිට කැපූ ගලින් සෑදි පියගැට පෙළ නැග යා යුතු වෙයි. පඩි පෙළ නැග වාහල්කඩින් ඇතුල් වී උඩමළුව වෙතට ගමන් කළ හැකි වේ. එතැනින් ඉහළට ගමන් ගන්නා විට දෙගල්දෙරුව නම් ස්ථනයට

පිවිසිය හැකි
ස්ථානයට
නම් තබා ති
පටු නැග්මට
යැයි කියනු
වෙහෙසින්
පැමිණිය හැ

කඳු මෙ
කුඩා චෛත
පසෙකින් ව
නිමල උඩම
මෙතෙක් සු
කරගත් සිත
කරවන සුළු
ලෙන් කීපය
ලකුණු දකි
පල්ලේමාල
සහිත පැරණි
ශේෂයක්ද
ලැබේ. කට
සම්බන්ධ ග
එහි බිත්ති
ඇති දේව
රටාද මෙහි
කරවයි. එ
සම්මත චතු
හැඩැති කුටි

"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ




# ...රණී
## ...තැන්න


විශාල ගල්කුළු දෙකකින් මැදිවූ
...ස් දෙගල්දෙරුව වශයෙන්
...යි. මේ මැදිවූ ඉතා අසීරු
...රැබිළි මාවත, ආකාශ ගව්ව
...බේ. ඒ අසීරු ආකාශ ගව්ව
...ණය කර මුදුන් තලය වෙත
...
...ලහි මුදුන් මළුවෙහි ඇති
...ද සමීපයේ වූ දිය පොකුණද,
...බෝධීන් වහන්සේද, නිසල
... පූජනීයත්වය පමුණුවා
...රත්වයෙන් ඇලීම්, බැඳීම් ඇති
...ල් සමාදන්
...පහත මළුවේ
... මේවාය් කටාරම්
...ට පුළුවන.
... උළුවස්සක්
...ද්වාලයක
...දී දකින්නට
... කෙටූ ගලකට
...ළුවස්සක්ද,
... සිතුවම් කර
... සහ මල් වැල්
...ැරණි බව සනාථ
... නිධන් ගල යැයි
...කාර කොටු
...සිපහකින්

සමන්විත පියනක් සහිත යන්ත්‍ර ගලෙහි ඉතිහාසය ගවේෂණය කරන්නකුට විශාල සාක්ෂියක් සපයා දී තිබෙයි. තවත් පැරණි නටබුන් රාශියක් මෙන්ම භාවනා යෝගීන් භාවිත කළ උපකරණ රාශියක්ද? උමං මාර්ග යක්ද කිසිවකුගේ පහසට නතු නොවූ ඝන අඳුර රජයන ගුහා කීපයක්ද මෙහි ඓතිහාසික රහස් සඟවාගෙන සිටින සෙයකි. මෙම ස්ථානය කෝට්ටේ යුගයේදී රහස් බළකොටුවක් වශයෙන් පැවැති බවද කියැවෙයි.

ක්‍රි.පූ. 103 දී වළගම්බා රජතුමා සොළී ආක්‍රමණයන්ගෙන් මිදී පලා විත් ලක්බිමේ නොයෙකුත් ආරක්ෂක ස්ථානයන්හි සැඟව සිටි බව අපගේ වංශ කතාවල කියැවේ. එසේ වළගම්බා රජතුමා සැඟවී සිටි ස්ථානයක් වශයෙන් මෙම මාළිගාතැන්නද ජනප්‍රවාදයට එක්වී තිබේ. මෙහි ඇති කුඩා ගල් ගෙයක් රජතුමාගේ ආරක්ෂිත වාසකුටියක් වූ බව ඇතැමෙක් විශ්වාස කරති. කාලිංග මාඝ විසින් ක්‍රි.ව. 1215 දී පමණ කළ කුරිරු ත්‍රස්ත ආක්‍රමණය නිසා බුද්ධ ශාසනයට මහත් විනාශයක් සිදුවිය. එකල වැඩ විසූ ශ්‍රී වාචිස්සර සංඝ රාජයාණන් වහන්සේ දන්ත ධාතුන් වහන්සේද, පාත්‍රා ධාතුන් වහන්සේද රැගෙන විත් ආරක්ෂිතව වඩා හිඳුවා පුද පූජා පැවැත්වූයේ මෙම ස්ථානයේදී බව කියැවෙන තවත් ජනප්‍රවාදයකි.

එසේම කෝට්ටේ යුගයේදී ශ්‍රී දළද වහන්සේ භාරව සිටි හිරිපිටියේ නිලමේතුමා දළද වහන්සේගේ ආරක්ෂාව වෙනුවෙන් මහත් කැපවීමෙන් කටයුතු කළ වීරවරයෙකි. හිරිපිටියේ නිලමේතුමා දන්ත ධාතුන් වහන්සේ සුරැකිව රැගෙන ගියේ මායාදුන්නේ රජතුමාගේ අනුග්‍රහයෙන් දෙල්ගමු රජමහා විහාරය වෙතය. ඒ යන ගමනේදී එක් සුරක්ෂිත කඳු මෙවුලක මාළිගාවක් තනා දන්ත ධාතුන් වහන්සේ තාවකාලිකව එහි තැන්පත් කළ බව ජනප්‍රවාද කතාවකි. ඒ එක්තරා කඳු මේඛලාව මාළිගාතැන්න ලෙස ප්‍රකටය. මුදුන් මළුවේ බෝධීන් වහන්සේ රෝපණය කළ ස්ථානයේ ඒ මාලිගය තනා තිබූ බවද කියැවෙයි. මෙසේ කඳු මෙව්ලක මුදුන් තලයේ තැන්නක වූ නිසා එතැන් පටන් එය මාළිගාතැන්න වශයෙන් නම් වූවා යැයි සිතිය හැකිය. මේ ජනප්‍රවාදයන් ද්විත්වය සත්‍යයක් වූයේ නම් දන්ත ධාතුන් වහන්සේගේ පූජනීය වූ පහස දෙවරක් වින්දනය කිරීමේ අතිමහත් වූ භාග්‍යය මේ කඳු මේඛලාව ලද විශිෂ්ට වරප්‍රසාදයකි.

**අසේනිකා රාජසූරිය**





...කු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)

දළදා වරුණ


මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

# වැරදි පිළිගැනීමට මැලි නොවෙමු

පුහුදුන් මනුෂ්‍යයන් තුළ වැරදි ඇතිවීම ස්වභාවයකි. තමන් තුළ තිබෙන වැරදි තමන්ට පෙනෙන්නේ නැත්නම් අනෙකකු තමන් තුළ තිබෙන වැරදි පෙන්වා දිය යුතුය. වැරදි යන මේ සිංහල වචනයට පාලි භාෂාවෙන් පවසන්නේ ''වජ්ජ'' යනුවෙනි. එය විග්‍රහ කරන්නේ ''වදිතබ්බං වජ්ජං'' යනුවෙනි. කිවයුතු නිසා වජ්ජ නම් විය. මේ අනුව වරදක් නම් කිව යුතුමය. පෙන්නා දිය යුතුමය. යමෙක් යමකුට වරද පෙන්නා දේ නම් වරද සහිත පුද්ගලයා ඒ තමන්ට වරද පෙන්නා දෙන පුද්ගලයාට ගරු බුහුමන් කරමින් ඇසුරු කළ යුත්තේ කෙසේදැයි පවසනවා නම් දුගියකුට මහා නිධානයක් පෙන්වා දෙන්නකු ඒ දුගියා තමන්ට මහා නිධානයක් පෙන්නා දුන් පුද්ගලයා ඇසුරු කරන්නාක් මෙනැයි දේශනා කොට වදාළේ ''නිධීනංච පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං'' යනාදී වශයෙනි.

තමන්ට තමන්ගේ වැරදි පෙන්නා දෙන්නා වූ තැනැත්තා පිළිබඳ තරාතිරමක් සැලකිය යුතු නොවේ. එයට හොඳ නිදර්ශනයක් නම් සැරියුත් මාහිමිපාණන් වහන්සේ පොරවාගෙන සිටි සිවුරෙහි කොනක් දික්වී තිබෙනු දුටු සත් හැවිරිදි සාමණේර නමක් ඒ බව කියා සිටි විට, සැරියුත් මාහිමිපාණන් වහන්සේ සිවුර මැනැවින් පොරවාගෙන උක්කුටිකයෙන් හිඳ ''තදහු පබ්බජිතො සන්තො ජාතියා සත්තවස්සිතකා සොපි මං අනුසාසෙය්‍ය, සම්පටිච්ඡාමි මුද්ධතා'' යනුවෙන් එදවස පැවිදි වූ සත්හැවිරිදි සාමණේර නමක් වුව, මට අනුශාසනා කරනවා නම්, ඒ අනුශාසනාව මා හිස මුදුණින්ම පිළිගන්නවා'' යයි කීහ. මේ පුවත අනුව තමන් තුළ යම් වරදක්, අඩුපාඩුවක් තිබෙනවා නම්, එය තමන්ට පෙන්වා දෙන පුද්ගලයා පිළිබඳ උසස් පහත් තත්ත්වයන් ගැන සැලකිලිමත් නොවිය යුතු බව වටහා ගත යුතු ය. යමකු තුළ මොනවා හෝ තිබෙනවා නම් ඒවා දැක දැක නිහඬ නොවිය යුතු බව බුදු දහමෙහි පැහැදිලි කොට තිබෙන්නේ ''ඔවුනොවුන්ගේ දුටු වරද කීමෙන් මෙත්තාවාචී කර්මය පුරා'' යන වශයෙනි. අනුන් තුළ තිබෙන වරද පෙන්නා දීම මෛත්‍රී වාක්කර්මය බව ප්‍රකාශ වන බැවින් එය පුණ්‍ය කර්මයකැයි තේරුම් ගත යුතුය. තමන්ට පෙන්නුම් කර දෙන්නා වූ තමන් තුළ පවත්නා අඩුපාඩු තේරුම් ගෙන මතු එම වැරදිවල නොයෙදෙමියි ඉටා ගැනීම උතුම් මහත්මා ගතියකි.

''දළදා වරුණ'' කියවන ඔබත් මේ කරුණ සිත්හි ධාරණය කොටගෙන, ධර්මානුකූලව ජීවත් වෙමින් මෙලොව පරලොව ජීවිතය සාර්ථක කරගැනීමට උත්සාහ කළ යුතුය. ■




එය හිස් අවකාශයක් නොවේ. ස්වභාව සුන්දරත්වයෙන් අනූන වූ, ඒ සුන්දරත්වයට ඓතිහාසික වටිනාකමක් එක්කළ, ඒ ඓතිහාසික වටිනාකමට පූජනීයත්වයක් එක්කළ, ඒ පූජනීයත්වය නිසාම බෞද්ධ ජනතාවට වන්දනාමාන කිරීමට අවැසි පවිත්‍ර වූ බිමක් ලෙස සැකසුණු පුදබිමක් නොහොත් ආරණ්‍ය සේනාසනයකි. යක්කල, රදවාන පාරේ අඹගස්පිටියේ සැතපුම් තුනේ කණුව අසලින් වැටී ඇති මග දිගේ තවත් කි.මී. දෙකහමාරක් පමණ පැමිණ මේ පුද බිම වෙතට පැමිණිය හැකිය.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මල්වතු හිරිපිටිය පස්ගම්මන යොන්ගම්මුල්ල අඹපිටිය සහ කඳුමුල්ල යන ග්‍රාමයනට මැදිව පුරාණ උෟරුවල මාවත ආසන්නයේ මුහුදු මට්ටමේ සිට අඩි අටසියයක් පමණ උස්වූ මෙ පර්වත භූමිය අදත් වහරන්නේ මාළිගාතැන්න යන ප්‍රකට නාමයෙනි.

අක්කර සිය ගණනක් පුරා විහිදෙන කඳු මේඛලාවක මත ගොඩ නැගී ඇති මාළිගාතැන්න වෙත නැගීමට පාදමේ සිට කැ ගලින් සැදි පියගැට පෙළ නැග යා යුතු වෙයි. පඩි පෙළ නැග වාහල්කඩින් ඇතුල් වී උඩමළු වෙතට ගමන් කළ හැකි වේ. එතැනින් ඉහළට ගමන් ගන්නා විට දෙගල්දෙරුව නම් ස්ථානයට

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යඇ

පුණ්‍ය භූමි




# ...න අරණ

## ...ළිගා තැන්න

පිවිසිය හැකිය. විශාල ගල්කුළු දෙකකින් මැදිවූ ස්ථානයට මෙසේ දෙගල්දෙරුව වශයෙන් නම් තබා තිබෙයි. මේ මැදිවූ ඉතා අසීරු පටු නැග්මට කුරුබිළි මාවත, ආකාශ ගව්ව යැයි කියනු ලැබේ. ඒ අසීරු ආකාශ ගව්ව වෙහෙසින් තරණය කර මුදුන් තලය වෙත පැමිණිය හැකිය.

කඳු මෙවුලෙහි මුදුන් මළුවෙහි ඇති කුඩා චෛත්‍යයද සමීපයේ වූ දිය පොකුණද, පසෙකින් වන බෝධීන් වහන්සේද, නිසල නිමල උඩමළුව පූජනීයත්වය පමුණුවා මෙතෙක් සුන්දරත්වයෙන් ඇලීම්, බැඳීම් ඇති කරගත් සිත සිල් සමාදන් කරවන සුළුය. පහත මළුවේ ලෙන් කීපයකි. මේවාය් කටාරම් ලකුණු දකින්නට පුළුවන. පල්ලේමාලයේ උළුවස්සක් සහිත පැරණි දේවාලයක ශේෂයක්ද මෙහිදී දකින්නට ලැබේ. කටාරම් කෙටූ ගලකට සම්බන්ධ ගල් උළුවස්සක්ද, එහි බිත්ති මත සිතුවම් කර ඇති දේව රූප සහ මල් වැල් රටාද මෙහි ඉපැරණි බව සනාථ කරවයි. එසේම නිධන් ගල යැයි සම්මත චතුරශ්‍රාකාර කොටු හැඩැති කුට්ර විසිපහකින් සමන්විත පියනක් සහිත යන්ත්‍ර ගලෙහි ඉතිහාසය ගවේෂණය කරන්නකුට විශාල සාක්ෂියක් සපයා දී තිබෙයි. තවත් පැරණි නටබුන් රාශියක් මෙන්ම භාවනා යෝගීන් භාවිත කළ උපකරණ රාශියක්ද? උමං මාර්ග යක්ද කිසිවකුගේ පහසට නතු නොවූ ඝන අඳුර රජයන ගුහා කීපයක්ද මෙහි ඓතිහාසික රහස් සඟවාගෙන සිටින සෙයකි. මෙම ස්ථානය කෝට්ටේ යුගයේදී රහස් බළකොටුවක් වශයෙන් පැවැති බවද කියැවෙයි.

ක්‍රි.පූ. 103 දී වළගම්බා රජතුමා සොළී ආක්‍රමණයන්ගෙන් මිදී පලා විත් ලක්බිමේ නොයෙකුත් ආරක්ෂක ස්ථානයන්හි සැඟව



...නුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සි...




# රණී
# තැන්න

ා. විශාල ගල්කුළු දෙකකින් මැදිවූ
ෙසේ දෙගල්දෙරුව වශයෙන්
ත්යි. මේ මැදිවූ ඉතා අසීරු
කුරුබිළි මාවත, ආකාශ ගව්ව
ැබේ. ඒ අසීරු ආකාශ ගව්ව
රණය කර මුදුන් තලය වෙත
ිය.
ලෙහි මුදුන් මළුවෙහි ඇති
යද සමීපයේ වූ දිය පොකුණද,
බෝධීන් වහන්සේද, නිසල
ව පූජනීයත්වය පමුණුවා
ිදරත්වයෙන් ඇලීම්, බැඳීම් ඇති
සිල් සමාදන්
. පහත මළුවේ
. මේවාය් කටාරම්
ට පුළුවන.
උළුවස්සක්
දේවාලයක
හිදී දකින්නට
ම් කෙටූ ගලකට
උළුවස්සක්ද,
සිතුවම් කර
ප සහ මල් වැල්
පැරණි බව සනාථ
ම නිධන් ගල යැයි
ශාකාර කොටු
විසිපහකින්


සමන්විත පියනක් සහිත යන්ත්‍ර ගලෙහි ඉතිහාසය ගවේෂණය කරන්නකුට විශාල සාක්ෂියක් සපයා දී තිබෙයි. තවත් පැරණි නටබුන් රාශියක් මෙන්ම භාවනා යෝගීන් භාවිත කළ උපකරණ රාශියක්ද? උමං මාර්ග යක්ද කිසිවකුගේ පහසට නතු නොවූ ඝන අඳුර රජයන ගුහා කීපයක්ද මෙහි ඓතිහාසික රහස් සඟවාගෙන සිටින සෙයකි. මෙම ස්ථානය කෝට්ටේ යුගයේදී රහස් බළකොටුවක් වශයෙන් පැවැති බවද කියැවෙයි.

ක්‍රි.පූ. 103 දී වළගම්බා රජතුමා සොළී ආක්‍රමණයන්ගෙන් මිදී පලා විත් ලක්බිමේ නොයෙකුත් ආරක්ෂක ස්ථානයන්හි සැඟව සිටි බව අපගේ වංශ කතාවල කියැවේ. එසේ වළගම්බා රජතුමා සැඟවී සිටි ස්ථානයක් වශයෙන් මෙම මාළිගාතැන්නද ජනප්‍රවාදයට එක්වී තිබේ. මෙහි ඇති කුඩා ගල් ගෙයක් රජතුමාගේ ආරක්ෂිත වාසකුටියක් වූ බව ඇතැමෙක් විශ්වාස කරති. කාලිංග මාඝ විසින් ක්‍රි.ව. 1215 දී පමණ කළ කුරිරු ත්‍රස්ත ආක්‍රමණය නිසා බුද්ධ ශාසනයට මහත් විනාශයක් සිදුවිය. එකල වැඩ විසූ ශ්‍රී වාචිස්සර සංඝ රාජයාණන් වහන්සේ දන්ත ධාතූන් වහන්සේද, පාත්‍රා ධාතූන් වහන්සේද රැගෙන විත් ආරක්ෂිතව වඩා හිඳුවා පුද පූජා පැවැත්වූයේ මෙම ස්ථානයේදී බව කියැවෙන තවත් ජනප්‍රවාදයකි.

එසේම කෝට්ටේ යුගයේදී ශ්‍රී දළදා වහන්සේ භාරව සිටි හිරිපිටියේ නිලමේතුමා දළදා වහන්සේගේ ආරක්ෂාව වෙනුවෙන් මහත් කැපවීමෙන් කටයුතු කළ වීරවරයෙකි. හිරිපිටියේ නිලමේතුමා දන්ත ධාතූන් වහන්සේ සුරැකිව රැගෙන ගියේ මායාදුන්නේ රජතුමාගේ අනුග්‍රහයෙන් දෙල්ගමු රජමහා විහාරය වෙතය. ඒ යන ගමනේදී එක් සුරක්ෂිත කඳු මෙවුලක මාළිගාවක් තනා දන්ත ධාතූන් වහන්සේ තාවකාලිකව එහි තැන්පත් කළ බව ජනප්‍රවාද කතාවකි. ඒ එක්තරා කඳු මේඛලාව මාළිගාතැන්න ලෙස ප්‍රකටය. මුදුන් මළුවේ බෝධීන් වහන්සේ රෝපණය කළ ස්ථානයේ ඒ මාලිගය තනා තිබූ බවද කියැවෙයි. මෙසේ කඳු මෙව්ලක මුදුන් තලයේ තැන්නක වූ නිසා එතැන් පටන් එය මාළිගාතැන්න වශයෙන් නම් වූවා යැයි සිතිය හැකිය. මේ ජනප්‍රවාදයන් ද්විත්වය සත්‍යයක් වූයේ නම් දන්ත ධාතූන් වහන්සේගේ පූජනීය වූ පහස දෙවරක් වින්දනය කිරීමේ අතිමහත් වූ භාග්‍යය මේ කඳු මේඛලාව ලද විශිෂ්ට වරප්‍රසාදයකි.

**අසේනිකා රාජසූරිය**





කු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# සඳකඩ පහණින් නිරූපිත බෞද්ධ දෘෂ්ටිය

ශ්‍රී ලංකේය කලාකරුවාගේ ශිල්පීයත්වය මෙන්ම දක්ෂතාවය විදහා දක්වනු ලබන සුවිශේෂී කලා නිර්මාණයක් වශයෙන් "සඳකඩ පහණ" පෙන්වා දිය හැකිය. පූජනීය භූමියකට පිවිසෙන පියගැට පාමුළ අර්ධ කවාකාර හැඩයෙන් යුතුව නිර්මාණය කර තිබෙන මෙම කලා අංගය ඉතා විශිෂ්ට වූවකි. සිංහල සාහිත්‍යයේ මෙවැනි "සඳකඩ පහණ" පිළිබඳව තොරතුරු හමුවන අතර අමාවතුරෙහි "අඩඝ ෂන්ද්‍ර පාෂාණ" යනුවෙන් දක්වා තිබේ. එසේම මෙරට අටුවා ග්‍රන්ථවල "සෝපාණ හෙට්ටිචන්ද්‍ර පාෂාණ" යනුවෙන් විස්තර කර තිබේ. අඩ සඳක හැඩයෙන් යුතු "සඳකඩ පහණ" ට දිගු ඉතිහාසයක් පවතී.

සඳකඩ පහණෙයි ස්වරූපය මුලින්ම ආයත චතුරස්‍රාකාර හැඩයක් ගෙන තිබෙන අතර, එවැනි සඳකඩ පහණක් අභයගිරියෙන් හමුවී තිබේ. මෙහි දෙවැනි අදියර වශයෙන් සඳකඩ පහණ දෙකෙළවර රවුම් හැඩයෙන් යුක්තව නිමාව ඇති අතර, එය භාවිතයේ පහසුව සඳහා නිම කරන ලද බවට සිතිය හැකිය. කාලයත් සමගම සඳකඩ පහණෙහි චක්‍ර ස්වරූපය වඩාත් කැපී පෙනෙන සේ දක්වා තිබේ. එසේම ඉතා සරලව ආරම්භ වූ සඳකඩ පහණ පසුව අර්ථ කවාකාර වළලු හතකින් යුතුව නිමකර තිබෙනු දක්නට ලැබුණත් එහි කිසිදු සැරසිල්ලක් නොමැති වීම විශේෂතාවකි.

"සඳකඩ පහණෙහි" විකාශනය සිදුවීමේදී මීළඟ අවස්ථාවේදී සිදුව ඇත්තේ "සඳකඩ පහණ" ඇතුළත කවයෙහි විකසිත නෙලුමක් සහ බාහිර කවය ලියවැලකින් සරසා තිබීමය. ඇතැම් සඳකඩ පහණවල ලියවැල වෙනුවට පලා පෙති මෝස්තර යොදගෙන

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

තිබේ. එම ලියවැලට අමතරව සත්ව රූප යොදාගෙන තිබීම දක්නට ලැබේ. එසේම සඳකඩ පහණෙහි අලංකාරය තීව්‍ර කරනු වස් ඇත්, අස්, ගව, මෙන්ම සිංහ යනාදී සත්ව රූපයන්ද යොදාගනු දක්නට ලැබේ.


අනුරාධපුර යුගයෙහි මුල්ම අවස්ථාවේ "සඳකඩ පහණ" ඉතා සරල චාම් එකක් වූ අතර පසුව එහි අලංකාරය සඳහා රූකම් යොදාගෙන තිබෙනු දැකගත හැකිය. මෙම යුගයේ සඳකඩ පහණ කලාත්මක නම්‍යශීලී කැටයම්වලින් සමන්විතය. අනුරාධපුර යුගයේ අලංකාරයන් ඉහළ තලයක පවතින සඳකඩ පහණ ලෙසින් බිසෝ මාලිගය අසල සඳකඩ පහණ පෙන්වා දිය හැකිය. මෙහි දක්වා තිබෙන අංගයන් පිළිබඳව පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

1. වන තීරුව - ගිනිදැල්
2. වන තීරුව - ඇත්, අස්, ගව, සිංහ රූප
3. වන තීරුව - ලියවැල
4. වන තීරුව - හංස පන්තිය
5. වන තීරුව - අර්ධ පද්මය

"නාගදැල්ල කැටයම් පිට වටේ ඇත
ඇත්, අස්, සිංහ, ගව එක පිළිවෙළට ඇත
ලියවැල, හංසවැල යළි පිළිවෙළට ඇත
යළි ලියවැලකි සියපත් සිය මැදට ඇත"

මෙරට කලාකරුවාගේ නිපුණත්වය විදහා දක්වනු ලබන මෙම සඳකඩ පහණ පිළිබඳව විද්වතුන් එයට අර්ථකථනයන් රැසක්ම ඉදිරිපත් කර තිබේ. ඇතමුන්ගේ අදහස වනුයේ මෙය සැරසිල්ලක් පමණක් වන බවයි. එහෙත් මේ සඳහා වැදගත් මෙන්ම අර්ථවත් අර්ථකථනයක් ලබාදීමට සෙනරත් පරණවිතාන මහතා සමත්ව තිබේ. ඔහු දක්වන අන්දමට සඳකඩ පහණෙහි ගිනිදැල්ල තුළින් සාමාන්‍ය ලෝකයක පවතින දුක්, කරදර පිළිබඳව අදහසක් දක්වනු ලබයි. එනම් සාමාන්‍ය ලෝකය දුක් කරදරවලින් ගහණව පවතින බවයි. ලෝකය ගින්නෙන් දැවෙන විට කුමන සිනාවක්ද? (ධම්මපදය) එසේම ඇත්, අස්, ගව සහ සිංහ යන සත්ව රූප තුළින් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන අංශයන් නිරූපණය කරන බව පරණවිතාන මහතාගේ අදහසයි. ලියවැල තුළින් මිනිසාගේ සියලු කරදරවලට හේතුවන තෘෂ්ණාව නිරූපණය කරනු ලබන බවට පරණවිතාන මහතා දක්වා තිබේ. එසේම සඳකඩ පහණෙහි සිව්වන තීරුව හෙවත් හංස පේළිය තුළින් බුද්ධිමත් මිනිසුන් ලොව ජීවත් වන බව දක්වනු ලබයි. තෘෂ්ණාව දුරලමින් නිසි මග ගමන් කරන සත්වයන් පිළිබඳව මෙන්ම ලෝකයේ නරක අතහැර ධර්මය අනුගමනය කරන පිරිස මෙයින් අර්ථ නිරූපණය වන බව පරණවිතානයන් දක්වා තිබේ. (හංසයා දියෙන් කිරි වෙන් කරගන්නවා සේ බුද්ධිමතා හොඳ නරක තේරුම් ගන්නා බව) එමෙන්ම මෙම සඳකඩ පහණෙහි අර්ධ පද්මය තුළින් නිර්වාණය වෙත ගමන් කිරීම සංකේතවත් කරනු ලබයි. තෘෂ්ණාව ප්‍රහීන කරමින් නිවන වෙත යොමුවන බවත් මෙයින් අදහස් වේ. මෙවන් අදහසක් පරණවිතාන මහතා විසින් ඉදිරිපත් කර තිබෙනුයේ සඳකඩ පහණ පහක් පමණ යොදාගෙනය. එහෙත් මෙම අදහස පොළොන්නරුව, මහනුවර වැනි යුගවල සඳකඩ පහණ සඳහා නොගැළපේ. මන්ද එම යුගයේ සඳකඩ පහණ්වලට වඩා වෙනස් ස්වරූපයක් ගැනීම නිසාවෙනි.

එමෙන්ම සඳකඩ පහණ පිළිබඳව උගතුන් විවිධ අදහස්, මතවාදයන් රැසක්ම ඉදිරිපත් කර තිබෙන අතර එම පුද්ගලයන් අතර බෙල් මහතාද අමතක කළ නොහැකිය.



එසේම ගුණපාල සේනාධීර මහතාද සඳකඩ පහන සඳහා අරුත් ගන්වා තිබෙන අතර, සියලුම සලකුණු මංගල සම්මත කරුණු සේ දක්වා තිබේ. මෙම සලකුණු තුළින් සෞභාග්‍යය සංකේතවත් කරන බවත්, එය ස්පර්ශය කරන්නාට එම ස්පර්ශ වීම තුළින් යහපතක් සැලසෙන බවත් සේනාධීර මහතාගේ අදහස වේ. සඳකඩ පහණ එදා අරුත් දක්වන විනී විතාරණ මහතා පවසනුයේ මෙයින් ඉර හඳ සංකේතවත් කරන බවත්, ඒ තුළින් සූර්ය වන්දනාව පිළිබඳ අදහසක් නිරූපණය වන බවත්ය.

**ගංගා කුමාරි දසනායක**

## රජවරුන් භාවිත කළ බවට තොරතුරු සඳහන් මහා බලගතු ගාථා රත්නයක්

'ජයො මුනින්දස්ස සුබොධි මූලෙ
අභොසි මාරස්ස පරාජයොහි
උග්ඝොසයුං දෙවගණා පසන්නා
එතෙන සච්චේන සුවත්ථි හොතු'

බොහෝ බලගතු ආනුභව සම්පන්න රත්නමාලා ගාථා මෙය යන්ත්‍රයක් ලෙසින් අකුරු පිහිටුවා ඇඳ පිරිත්කර පැළඳීමෙන් හා නිවසේ මුල් දොරටුවේ ඉහළින් පරිස්සම් ලෙස තැබීමෙන් සියලු ආරක්ෂාව සහ යහපත සැලසේ.

සං සාර සාරොස විනීත     ණීසං
සං නීත සාතං සුවිසාර     ධීසං
සං ධීරතං සොණ්ණ තනු     පලාසං
සං ලාප දෙසිං පණමේහි     සාසං

සං සාහිගං කොවල මොහ     නාසං
සං නාහකං මාර රණෙ     විසෙසං
සං සෙවිතං දසි මුදර     භාසං
සං හාර ධම්මං පණමෙ     සදසං

සං දසගං නාසිත තාප     නාසං
සං නාපමං සිං හත සොර     පාසං
සං පාරගාමිං සුවිසාර     වාසං
සං වාර සංසං පණමෙ     රසාසං


මෙහිදී පිරිත් සූත්‍ර හා බුදු ගුණ කියැවෙන ගාථා යන්ත්‍ර වශයෙන් පිළියෙළ කර පැළඳීම සිදුකරන බව අපි දනිමු. ඒක පිළිබඳව ගරුතර ස්වාමීන් වහන්සේලා විසින් අදහස් දක්වන ලද අතර එය යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරන අය විසින් කරනු ලබන බැව් පවසා සිටියහ. එහෙත් උන්වහන්සේලා විසින් පවසන ලද්දේ එම යන්ත්‍ර ආදිය මගින් සෙත් ශාන්ති ලබාගත් බොහෝ පිරිස් සිටින බවයි. වර්තමානයේ ඇතැම් පිරිස් මෙම යන්ත්‍ර නියමිත ක්‍රමයට සකස් නොකොට මුදල් ඉපයීම සඳහාම කටයුතු කරන බව පවසන ලදී. මෙවැනි මිථ්‍යා දේ නිසා පිරිතේ ඇති අගයත් එහි ඇති බලගතු ශක්තියත් නියම ලෙසින් දකගත නොහැකි බැව් සඳහන් කරයි. නව අරහාදී බුදුගුණ සහිත ''රතන සූත්‍රය'' මිනිසාට බොහෝ ප්‍රයෝජනවත් සියලු සුබසිද්ධියට අදළ යන්ත්‍රයන්ය. මේවා බොහෝ දෙනා නොයෙක් අයුරින් ප්‍රස්තාර කර අඳිනු ලබන අතර මින් කොයි යන්ත්‍රය වුවත් පිරිතේ ගුණය හා බලය ඇති නිසා ඒවා මහානුභාව සම්පන්නය.

මේ අයුරින්ම සීවලී පිරිතත් ප්‍රස්තාර කර ඇඳ සිද්ධි කර ගෘහයන්හි තැන්පත් කර තැබීමෙන් ආරක්ෂාව හා යසස සැලසේ. මෙම සීවලී යන්ත්‍රයද ක්‍රම කීපයකට ප්‍රස්තාර කර අඳින අයුරු දකිය හැකිය. මෙසේම අභිසම්භිදන සූත්‍රයද යන්ත්‍රයක් ලෙස ප්‍රස්තාර කර සිද්ධි කර පැළඳීම සඳහා සකස් කරන අයුරු දකගත හැකි විය. ආරක්ෂා සහිත ජලනන්දන පිරිතද ප්‍රස්තාර කර සිද්ධි කර ගෙලේ පැළඳීම සඳහා සකස් කරනු ලබයි. මීට අමතරව ඒ ඒ පිරිත් සූත්‍රවලින් කළ හැකි හාස්කම් බොහෝය. මේ මගින් ගෘහ ජීවිතය සැපවත් කරගැනීමටත්, ආරෝග්‍ය සම්පත්තිය වැඩි දියුණු කරගැනීමටත් තමා බලාපොරොත්තු වන දේ ඉටුකර ගැනීමටත් සෙත් ශාන්තිය ළඟා කරගැනීමටත් හැකිය. වර්තමානයේ බොහෝ දෙනා පිරිත් මගින් තම ජීවිතය යහපත් කරගැනීමට පෙලඹී සිටින්නේ එහි ඇති මහානුභාව සම්පන්න ගුණය ඇස් ඉදිරිපිට පසක් වී පෙනෙන බැවිනි. ඉතා හොඳින් ජේවී ගුණගරුකව යහපත් සිතිවිලි දල්වා පිරිත් දේශනා පැවැත්වීමෙන් නිරන්තරයෙන්ම යහපත ළඟා වේ. එය සත්‍යයකි.

''අභිවාදන සීලිස්ස - නිච්චං වුද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණො සුඛං බලං''

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි - කැලණිය**


## පැවිදි දිවියට



මහනුවර, අස්ගිරිය මහා විහාරයීය කර්මාචාර්ය සංඝානන්ද පිරිවෙණෙහි නියෝජ්‍ය පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත, පාලි භාෂා සංසදයේ ලේකම් මැණික්හින්නේ රතනසාර හිමිගේ ආචාර්යත්වයෙන් ඩී. එම්. අසේල මධුසංඛ දිසානායක කුල කුමරු උඩදුම්බර චන්දරතන යන පැවිදි නමින් ප්‍රව්‍රජ්‍යා බිමට ඇතුළත් විය.

අසේල මධුසංඛ දිසානායක කුල කුමරුවා දිසානායක මුදියන්සේලාගේ ජයවීර දිසානායක, අබේකොන් මුදියන්සේලාගේ චන්ද්‍රලතා කුමාරි යන යුවලගේ පුත්‍ර රත්නයකි.

## මහනුවර ශ්‍රී පුෂ්පදාන පොසොන් පෙරහර



**මහනුවර** ශ්‍රී පුෂ්පදන සමිතිය මගින් පොසොන් පුර පසළොස්වක පෝය දින පවත්වන ලද පොසොන් මහ පෙරහරේ මිහිඳු මාහිමි වැඩමවන පෙරහර මහනුවර වීදි සංචාරය කළ අවස්ථාව.

# ශ්‍රී දළදා සමිඳු තේවා මුරය

## අස්ගිරි මහා විහාරයට පැවරීම ඇසල පෝයට පසුදා

ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රී දළදා සමිඳු උදෙසා සිදුකෙරෙන තේවා මුරය මල්වතු මහා විහාරයෙන් අස්ගිරිය මහා විහාරයට චාරිත්‍රානුකූලව පැවරීම මෙම මස යෙදෙන ඇසළ පුර පසළොස්වක පෝය දිනයෙන් පසු දින සිදු කෙරේ. ගිය වසරේ එනම් 2015 ඇසළ පෝය දිනයෙන් පසු ශ්‍රී දළදා සමිඳු උදෙසා තේවාව මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල මාහිමි අනුශාසනා පරිදි මල්වතු මහා විහාරයීය මහා සංඝරත්නය විසින් පවත්වාගෙන එනු ලබන්නේය.

මෙම ඇසළ පෝය දිනයෙන් පසු ශ්‍රී දළදා සමිඳු තේවාව මුරය සඳහා ශ්‍රී දළදා මාලිගාවට වැඩම කරන අස්ගිරි මහා විහාරයීය මහා සංඝරත්නය ඉදිරියට එළඹෙන වස්සාන සෘතුව සඳහා ශ්‍රී දළදා මාලිගාවේ වස් එළඹීමද චාරිත්‍රානුකූලව සිදුකෙරේ.

තේවාව මුරයට පත්වන අස්ගිරි මහා විහාරයට තේවාව භාර දීමේ චාරිත්‍ර අවස්ථාවට මල්වතු පාර්ශ්වයේ මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල, අස්ගිරි පාර්ශ්වයේ මහානායක වරකාගොඩ චන්ද්‍රරතන මහනාහිමි දෙනම ප්‍රධාන දෙපාර්ශ්වයේ අනුනායක හිමිවරු, ලේඛකාධිකාරී හිමිවරු සහ තේවාවට පත්වන අස්ගිරිය මහා විහාරයේ මහා සංඝරත්නය සමග දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතාද සහභාගි වනු ඇත.

## මහියංගන රජමහා විහාරාධිපති පදවියෙන් පිදුම් ලබති

ඓතිහාසික මහියංගන රජමහා විහාරාධිපති පදවියෙන් පිදුම් ලැබූ අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික අස්ගිරිය මහා විහාරයේ උරුලෑවත්ත පන්සල, හුම්බුළුව රජමහා විහාරය, ගිරාඳුරුකෝට්ටේ ගින්නෝරුව ශ්‍රී විජයසුන්දරාරාමය, උරුලෑවත්ත පුරාණ විහාරය යන සිව්මහා විහාරාධිපති පණ්ඩිත උරුලෑවත්තේ ධම්මසිද්ධි ශ්‍රී අත්ථදස්සි ධම්මරක්ඛිත නාහිමිපාණන්ට ශ්‍රී සන්නස් පත්‍රය ප්‍රදානය කිරීම නිමිත්තෙන් ඓතිහාසික අස්ගිරිය මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී අස්ගිරි පාර්ශ්වයේ මහානායක වරකාගොඩ ශ්‍රී ඥානරතන මාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද උත්සවයේදී ගිහි පින්වතුන් නියෝජනය කරමින් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතා ආශිර්වාදාත්මක කතාව පැවැත්වූ අවස්ථාව.






## පියරතන හිමිගේ දහම්පොත් දෙරට වඩී

මහනුවර අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ මහෝපාධ්‍ය ශාස්ත්‍රවේදී පණ්ඩිත අමුණුපුර පියරතන හිමි විසින් ලියන ලද තෙරුවන් වන්දනාවේ ආනිශංස සහ මහින්දගමනේ අසිරිය හා 'අස්ගිරිය විජයසුන්දරාරාමයේ අසූ මහා ශ්‍රාවක පූජාව' යන ධර්ම පොත් දෙක එළිදැක්වීමේ චාම් උත්සවයක් පසුගියදා විජයසුන්දරාරාමයේදී පැවැත්විණි. එහිදී පොත් දෙකේ පිටපත් අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික මොලගොඩ ධම්මරතන ලොකු හාමුදුරුවන් වහන්සේ වෙත පියරතන හිමි විසින් (දකුණේ) පිළිගැන්වූ අවස්ථාව. මෙම ධර්ම පොත් දෙක සමග පියරතන හිමි විසින් 'ප්‍රථම උදානය', 'ධර්ම දේශනාව', 'ගිරිමානන්ද සූත්‍රය' හා 'දෙලොව ශාන්තිය', 'අස්ගිරි විජයසුන්දරාරාමය' මැයින් ධර්ම ග්‍රන්ථ හතරක් සංස්කරණය කර ඇත.

## ශාස්ත්‍රපති ඇටිපොල මහින්දහිමි අස්ගිරිය මහා විහාරයීය කාරක සංඝ සභාවේ කාරක සභික පදවි ලබති




මහනුවර අස්ගිරිය මහා විහාර පිරිවෙන් නියෝජ්‍ය පරිවෙණාධිපති, වටපුළුව ශ්‍රී කල්‍යාණ බෞද්ධ මධ්‍යස්ථානාධිපති මහනුවර ශ්‍රී නාථ දේවාල විහාරවාසී, නාථ දේවාල දහම් පාසලේ ප්‍රධානාචාර්ය, කර්මාචාර්ය ශාස්ත්‍රපති ඇටිපොල මහින්ද හිමි, අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ කාරක සභික ධුරයට අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ මහානායක වරකාගොඩ ඥානරතන මාහිමි විසින් පත්කර ඇත.

කේ. බණ්ඩාරනායක

ධම්ම පදයෙන් දහම් ඔවදන් අංක 07

# පෙන්නා දුන් එද්‍ර බුදුහිමි ඇත්නම් මෙම කරුණු පිරිහෙයි

## පූජිතය ජීවිතය



**සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියේසු අසංවුතං**
**භෝජනම්හි අමත්තඤ්ඤුං - කුසීතං හීන වීරියං**
**නං වේ පසහති මාරෝ - වාතෝ රුක්ඛංව දුබ්බලං**

- ධම්මපදය යමක වග්ගය

යහපත් යැයි බලමින් වාසය කරන්නා වූ, ඉන්ද්‍රියයන්හි සංවරයක් නැති, ආහාරයෙහි පමණ නොදන්නා, කම්මැලි වූ, පහවූ වීර්ය ඇති පුද්ගලයා ඒකාන්තයෙන් මාරයා මැඩලයි. වාතය දුර්වල වූ ගසක් මැඩලන්නාක් මෙනි.

පුද්ගලයකු මෙලොව වශයෙන් පරිහානියට පත්වන කරුණු 5 ක් මෙම ධම්මපද ගාථාවෙන් බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. එය මෙහි දක්වා ඇත්තේ මාරයා විසින් කරන මැඩලීමක් ලෙසය. මාරයා යන්නෙන් සංකේතවත් කරන්නේ පිරිහීමයි.

සාමාන්‍ය සමාජයේ පිරිහීම යන්නෙන් අර්ථවත් වන දේට වඩා ගැඹුරින් මෙහි පිරිහීම යන්න විවරණය කරයි. අපූර්ව උපමාවන් තුළින් එය මනාව පැහැදිලි කර දී ඇත. දිරාගිය දුර්වල ගසක් කෙසේවත් සුළඟට හසුවී බිමට නොවැටෙන්නේ නැත. ඒකාන්තයෙන්ම බිම වැටී සුනු විසුණු වී යන්නේය. එමෙන්ම ඉහත ගාථාවේ දැක්වූ කරුණු පහ යම් පුද්ගලයකු තුළ පවතින්නේ නම් ඔහු ඒකාන්තයෙන්ම පිරිහී විනාශ වී යන්නේය.

මෙහි සඳහන් පළමු පිරිහී යන කාරණය නම් කාමභෝගී ජීවිතය සුබ යැයි විසීමයි. (සුභානුපස්සිං විහරන්තං) එවන් පුද්ගලයාගේ එකම ලක්ෂණය වන්නේ ඉන්ද්‍රියානුබද්ධ කාම වස්තු තමන්ටම අයිති කර ගැනීමයි. ඔහු ගසක වැලක පිපෙන මලක් දෙස පවා බලන්න් ඉන් නිරාමිෂ සතුටක් විඳීමට නොව එය වෙන් කරගෙන රැගෙන යාමටය. පුරුෂයකු ගැහැනියක දෙස බලන්නේ ඇය හා කාමුකව හැසිරීමටය. කැමති ආහාරයක්, පානයක් දෙසද ඔහුගේ ආකල්පය අන් අයටත් නොවී තමාට වෙන්කර ගෙන රස විඳීමටය. මේ ආකාරයට කාමභෝගී ජීවිතයම සුබ යැයි සිතා සලකන්නා සමාජයේ නිතැතින් පිරිහීමට ලක්වේ. ඔහු අප්‍රිය කරයි. සමූහයෙන් පිළිකුල් ලෙස ඈත්කර තබයි.

දෙවන පිරිහීමට පත්වන කාරණය නම්, ඉන්ද්‍රිය අසංවරයයි. (ඉන්ද්‍රියේසු අසංවුතං) ඉන්ද්‍රියයන් ලැබී ඇත්තේ පිනවීමටය. එය සැබෑය. එහෙත් ඔබට සිතෙන පරිදි ඉන්ද්‍රිය පිනවීමට ඉඩක් හෝ අයිතියක් ඔබට නැත. තමන්ටත්, අනුන්ටත් අයහපතක් නොවන සමාජ සම්මත සිරිත් විරිත් ඔස්සේ හැඩගැසුණු සීමාවක සිටයි ඔබ ඉන්ද්‍රිය පිනවිය යුත්තේ. ඔබේ ඉන්ද්‍රිය පිනවීම ඉන් බැහැර නම් ඔබ ඒකාන්තයෙන් පිරිහෙන්නේය.

තුන්වන කාරණය ආහාරයෙහි පමණ නොදැනීමයි. (භෝජනම්හි අමත්තඤ්ඤුං) මෙයින් අර්ථවත් කරන්නේ තමා ගන්නා ආහාරය මෙපමණ විය යුතු යැයි දැනසිටීම පමණක් නොවේ. සුදුසු නුසුදුසු ආහාර, ඒවා ගත යුතු වේලාව, තම වයසට ගැළපෙන බව ආදිය ගැන සිතා 'කට' පාලනය කරගනිමින් ආහාරය හා සම්බන්ධව කටයුතු නොකරන්නේ නම් ඔබ රෝගී පුද්ගලයෙක් වේ. විටෙක සමාජ ගැරහුම්වලට ලක්වේ. එමෙන්ම පිළිකුලට ලක්වේ.

කම්මැලිකම (කුසීතං) මෙහි දක්වා ඇති සිව්වන පිරිහෙන කාරණයයි. සීතල, උෂ්ණ, වේලාව, අවේලාව ආදී සාධකවලට ඔබේ ජීවිතය භාර දී ඔබේ යහපත් වැඩ අතපසු කරන්නේ නම් එහිම ඔබේ පිරිහෙන ජීවිතය ඇති බව විස්තර කොට දැක්විය යුතු නැත.

අනෙක් පසින් උත්සාහය අතහැර දැමීමද (හීන වීරියං) ඔබේ ජීවිතය පිරිහීමට පත්වන්නකි. ඒ පස්වන කාරණයයි. ඔබේ ජීවිතයට අර්ථයක් අපේක්ෂා කරන ඔබ, උත්සාහයෙන් කටයුතු ආරම්භ කළ යුතුව ඇත. (ආරම්භක ධාතු) එමෙන්ම උද්‍යෝගිමත්ව එහි නිරතවීමද අවශ්‍යය. (පරක්කම ධාතු) යහපත් නිමාවද උද්‍යෝගයෙන් පිළිගත යුතුය. (නික්කම ධාතු) මෙය තවදුරටත් පැහැදිලි කරන්නේ ප්‍රතිඵල දකින තෙක් උත්සාහය පැවතිය යුතු බවයි. 'වායමේතේව පුරිසෝ යාව අත්ථස්ස නිප්පද'.

ඔබේත්, ඔබ හා බැඳුණු අන් අයගේත් එකම පැතුම ඔබට ලස්සන ජීවිතයක් උරුම වීමයි. ඒ දියුණුව කරා යන්නකි. එය ඔබට, ඔබේ ඥාති හිතෛෂීන්ට පමණක් නොව සමස්ත සමාජයටම වැඩදායී වන්නකි. එහෙත් ඔබේ ජීවිතය ඉහත කරුණු පහෙන් වෙළී ඇත්නම් ඒ නිසාම ජීවිතය පිරිහුණු එකක් නම් ඔබත්, සමාජයක් අපේක්ෂා කළ ඒ යහපත් ජීවිතය අහිමි වන්නේය. ඔබ කැමතිද පිරිහුණු එකක් ලෙස, ප්‍රතික්ෂේපිත එකක් ලෙස ඔබේ ජීවිතය පවත්වාගෙන යන්නට. නැහැ නේද? මඳක් සිතන්න. ඉහත කරුණු පහෙන් බිඳක් හෝ ඔබේ ජීවිතය හා බැඳී ඇත්නම් එය අතහැර ලස්සන ජීවිතයක් උරුම කරගන්න. ඊට මේ බුදු මග හැර අන් මගක් නැත.

ගරු උපදේශක ලලිත් අබේසේකර



තමන්ට උපකාර කළ තැනැත්තාට

# උපද්‍රව කරන්නා මෙලොවත්, පරලොවත් දෙකෙහිම පිරිහෙන බව කියැවෙන

# තක්ක ජාතකය

තිලොවට තිලක වූ, කරුණාවට නිධාන වූ, ලොවට වැඩ සැලසූ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි උකටලීව සිටි භික්ෂුවක් අරභයා මෙම තක්ක ජාතක කතාව දේශනා කොට වදාළ සේක. බුදුරජාණන් වහන්සේ ඒ මහණ භික්ෂුව කැඳවා, ඔහු අමතා, 'මහණ, ඔබ උකටලී වූ බව සැබෑදැයි' විචාළ සේක. එයට හේතුව කුමක්දැයි විමසා, දැන්වූ විට 'ස්ත්‍රීහු නම් කළ උපකාර නොදන්නාහුය. මිත්‍ර ද්‍රෝහිය. එබඳු ස්ත්‍රියක් නිසා උකටලී වූයේ ඇයිදැයි' මෙම අතීත කථාව ගෙනහැර දක්වා වදාළ සේක.

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"

බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍යය කරන කාලයෙහි අප මහාබෝසතාණන් වහන්සේ පැවිදිව ගංගා තීරයක අසපුවෙක ධ්‍යාන වඩමින් වාසය කළ සේක. එසමයෙහි බරණැස් නුවර සිටාණන්ට දූ කුමරියක් සිටියාය. ඇය චණ්ඩය, පරුෂය. දැසිදස්සන්ට ආක්‍රෝෂ පරිභව කරන්නීය. පහර දෙන්නීය. එක් දවසෙක අයැගේ දැසිදස්සෝ ඒ කුමාරිකාව කැඳවාගෙන ගංගාවෙහි දිය කෙළිමු'යි කියා කැඳවාගෙන ගියහ. ජල ක්‍රීඩා කරද්දී සවස් විය. මහාවර්ෂාවක් පටන් ගත්තේය. වසින විට සිටු දූවගේ දැසිදස්සෝ කුමාරිකාව ගඟ මැද තනිකර දමා ගොඩට ගියාහුය. නොනැවතී වර්ෂාව වැස්සේය. සූර්යයා ද බැස ගියේය. අන්ධකාරය පැමිණියේය. සේවකයෝ කුමාරිකාවගෙන් වෙන්ව සිටුගෙට ගොස් කුමාරිකාව කොයිදැයි විචාළ කල්හි, කුමාරිකාව කොතනක ගියේදැයි නොදන්නා බව කීවාහුය. නෑයෝ ද පැමිණ පරීක්ෂා කොට නොදැක, ආපසු ගියහ. කුමාරිකාව ජල පහරින් පහළට ගසාගෙන යන විට, බැගෑපත්ව හඬමින් බෝධිසත්වයන්ගේ පන්සල සමීපයට පැමිණියාය. බෝසතාණන් වහන්සේ ස්ත්‍රියගේ ඇඬුම් ශබ්දය අසා, මාගමකගේ ශබ්දය යැයි සිතා මෑට පිහිට වී ආරක්ෂා කරන්නෙමි'යි සිතා, ගිනි සුළක් ගෙන, ගංතෙරට ගොස්, ගඟ මැදට පීනා ගොස් ඒ ස්ත්‍රිය ඔසවා ගෙන අසපුවට පැමිණ සීතලට ගිනි දල්වා දී, සීතල පහවූ කල්හි පලාඵල ආහාර පිණිස දුන්හ. ඒ පලාඵල අනුභව කළ ස්ත්‍රිය අතින් කොහි සිට ආවේද? කොහි වසන්නේදැයි විමසා, ගඟට වැටුණු තැන් සිට තොරතුරු අසා දැනගත්තේය.

එවිට බෝධිසත්වයන් වහන්සේ ඒ ස්ත්‍රියට මෙහි වාසය කරවයි කියා පන්සලේ වාසය කරවා දෙතුන් දවසක් බෝධිසත්වයන් වහන්සේ ගෙයින් පිටව එළියෙහි වාසය කර දැන් ඇයට ඇගේ නිවසට යන්නැයි කීවේය. එවිට ඒ ස්ත්‍රිය මේ තපස්වීන් වහන්සේගේ සිල් බිඳින්නෙමැයි සිතා, නොයා සිටියාය. කල් යන විට ස්ත්‍රී ලීලාව දක්වා බෝධිසත්වයන්ගේ සීලය බිඳ ධ්‍යානය අතුරුදහන් කළාය. මෙසේ සිටිනා අතර, මෙම ස්ත්‍රිය, ස්වාමීන් වහන්ස, අප මේ ආරණ්‍යයෙහි වාසය කරන්නේ කුමකට ද? මනුෂ්‍ය වාසයකට ගොස් ජීවත් වෙමුයි පැවසුවාය. එබස් ඇසූ බෝධිසත්වයන් වහන්සේ ඒ ස්ත්‍රිය කැඳවාගෙන එක් පසල් ගමකට ගොස් මෝරු විකිණීමේ මෙහෙයක් ලබා ජීවිකාව කොට ඒ ස්ත්‍රිය ආරක්ෂා කළ සේක. අප බෝසතාණන් වහන්සේ මෝරු විකුණා ජීවත්වන හෙයින් තක්‍ර පණ්ඩිතයෝ නමින් ප්‍රසිද්ධ වූහ.

මෙසේ වාසය කරන සමයෙහි අප මහාබෝසතාණන් වහන්සේට ඒ ගම්වැසියෝ වැටුප් දී අපට හොඳ නරක කියා දෙමින් මේ ගම් දොරෙහි කුටියක වාසය කරන්නැයි ඉල්ලා එහි වාසය කරවා ගත්හ. එසමයෙහි සොරුන් කණ්ඩායමක් පර්වතයකින් බැස පසල්දනව්ව පහරමින්, එක් දවසක් එම ගම පැහැර වැසියන් ලවා බඩු පොදි බඳවා ගෙන යන විට මේ සිටු දූව දැක අල්ලාගෙන ඒ සිටුදියණියගේ රූපයෙහි ඇලුණු සොර නායකයා තමන්ගේ භාර්යාව වශයෙන් තබා ගත්තේය. බෝධිසත්වයන් වහන්සේ මෙනම් ස්ත්‍රිය කොහිදැයි විමසා, සොරදෙටුවා අල්වාගෙන ගොස් භාර්යාව කරගත්තේයැයි අසා, මේ ස්ත්‍රිය මා නොමැතිව නොවසන්නේය, දිව අවුත් මගේ සමීපයට එන්නේ යැයි සිතා, ඇගේ පැමිණීම බලමින් ගම්හි වාසය කළහ. සිටු දූව ද, මම මෙහි සැපසේ වසන්නෙමි. කලකින් මගේ තක්‍ර පණ්ඩිතයන් වහන්සේ කිසි දෙයක් නොතකා අවුත් මා මෙතනින් කැඳවාගෙන යනු ඇත. එවිට මම මේ සැපයෙන් පිරිහෙන්නෙමි. එබැවින් කිසියම් ක්‍රමයකින් තක්‍ර පඬිවරයා කැඳවා ගෙන විත්, මැරවූයේ නම් ඉතා යහපතැයි සිතුවාය.

ඒ ස්ත්‍රිය එක් මිනිසෙකු කැඳවා, මා මෙතන දුකින් සිටින බවත්, තක්‍ර පණ්ඩිතයන් අවුත් මා ගෙන යන්නැයි හසුනක් යැවුවාය. අප බෝසතාණන් වහන්සේ එය අදහාගෙන ස්ත්‍රිය සොයා ගියේය. ඇය ඔහු දැක ස්වාමීන් වහන්ස, අප දෙදෙනා දැන් ගිය හොත් සොරදෙටුවා අප එළවාගෙන විත් දෙදෙනාම නසයි. රාත්‍රියෙහි යමුයි කියා තක්‍ර පණ්ඩිතයන් වහන්සේ කැඳවාගෙන අවුත්, ආහාර අනුභව කරවා, කොටුවෙහි හිඳවා සවස් වේලෙහි සොරදෙටුවා අවුත් සුරාපානය කොට මත්වූ විට, ස්වාමිපුරුෂය, ඉදින් මේ වේලාවෙහි තොපගේ සතුරා දුටුවේ නම් ඔහුට කවරක් කරන්නේ දැයි විමසුවාය. එවිට සොර දෙටුවා මෙනම් දෙයක් කරන්නෙමැයි කීහ. කිමෙක් ද? එතෙම දුර තැනක නොවේදැයි ඇසීය. ඔහු කොටුවෙහි සිටින්නේ යැයි ඇය කීවාය. එවිට සොර දෙටුවා තණ සුළක් ගෙන එහි ගොස් බෝසතාණන් දැක, අල්වාගෙන ගේ මැද හෙළා කැමති පරිද්දෙන් තැලුවේය.

බෝසතාණන් වහන්සේ තැලුම් ලබමින් අන් කිසිවක් නොකියා 'ක්‍රෝධනා අකතඤ්ඤූච පිසුනාමිත්ත දුබ්භිකා' කියමින් තැලුම් කෑම ඉවසා සිටියේය. සොර දෙටු තෙම බෝසතාණන් වහන්සේ පිටුතල හයා බැඳ නිදි ගන්වා තමන් ආහාර අනුභව කොට රා මදය අඩු වූ විට නැවතත් තලන්නට පටන් ගත්තේය. එහිදී ද බෝසතාණන් වහන්සේ 'ක්‍රෝධනා අකතඤ්ඤූච පිසුනාමිත්ත දුබ්භිකා' යන පද සතර පමණක් වදාළ සේක. මේ පුරුෂයා තලන විට අන් කිසිවක් නොකියා මේ සතර පදයම කියයි. මේ ගැන ඔහුගෙන් විචාරමි'යි සිතා ස්ත්‍රිය නිදාගත් බව දැන තක්‍ර පණ්ඩිතයන්ගෙන් එය විචාළේය. තක්‍ර පණ්ඩිතයන් වහන්සේ එසේ නම් අසන්නැයි කියා ඒ කාරණය මුල පටන් අග දක්වා පැවසූහ.

මම පෙර වනාන්තරයෙහි වාසය කරන විට තපස්වී කෙනෙක්ව ධ්‍යාන ලාභියෙක් වූයෙමි. මේ ස්ත්‍රිය ගංගා




ජලයෙහි ගසාගෙන යනු දැක ගොඩට ගෙන සත්කාර කළෙමි. එසේ කළා වූ මා මේ ස්ත්‍රිය විසින් පොළඹා ධ්‍යානයෙන් පිරිහීමට හෙලුවාය. ධ්‍යානයෙන් පිරිහුණු මම ආරණ්‍යය හැර මේ ස්ත්‍රිය පෝෂණය කරමින් පසල් ගමක වාසය කළෙමි. එවිට මේ ස්ත්‍රිය සොරුන් විසින් ගෙන ගොස් මම දුකින් වාසය කෙරමියි මා කැඳවාගෙන යවැයි දන්වා හසුන්පතක් එවා, මා එහි ගිය විට චෞරයාට දන්වා මා විනාශ කිරීමට කටයුතු කළාය. ඒ නිසා මම මෙසේ කීවෙමියි පැවසූහ.

එවිට සොර දෙටුවා යම් බඳු මේ ස්ත්‍රිය මෙබඳු ගුණයෙන් යුක්ත, තමන්ට උපකාර කළ තැනැත්තාට උපද්‍රව කරන්නේ නම් මට කුමන උපද්‍රවයක් කළ නොහැකි ද? මැය හැරිය යුතුයි සිතුවේය. සොර දෙටුවා තක්‍ර පණ්ඩිතයන් අස්වසා ඒ ස්ත්‍රිය කැඳවාගෙන නික්ම, මේ පුරුෂයා ගම්දොරේ දී ඝාතනය කරන්නෙමැයි කියා, ගමෙන් පිටතට ගොස්, මොහුගේ අත අල්වාග න්නැයි කියා, බෝසතුන් අල්වා ගැනීමට සලස්වා කඩුව ගෙන තක්‍ර පණ්ඩිතට පහර දෙන්නාක් මෙන් ඒ ස්ත්‍රියට කඩුවෙන් කොටා, තක්‍ර පණ්ඩිතයන්ට කීප දවසක් ප්‍රණීත ආහාරයෙන් සංග්‍රහ කොට, කොහි වඩිනසේක්දැයි ඇසූ විට, තක්‍ර පණ්ඩිතයෝ, මට ගිහියන්ගෙන් ප්‍රයෝජන නැත. ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව වනයෙහි වසන්නෙමැයි කී විට, එසේ නම් මාත් පැවිදි වන්නෙමැයි කියා, දෙදෙනාම වනයට ගොස්, පඤ්ඤාභිඤ්ඤා අෂ්ටසමාපත්ති උපදවා, ජීවිතාවසානයෙහි බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ.

බුදුරජාණන් වහන්සේ මේ අතීත වර්තමාන කථා වදාරා පූර්වාපර සන්ධි ගලපා ලූ සේක. මහණ මේ ස්ත්‍රීහු නම් ක්‍රෝධයෙන් යුක්ත වූවාහුය. උපන් ක්‍රෝධය වළක්වා ගන්නට නොදනිති. ප්‍රිය ශූන්‍ය කථා කෙරෙහි මිත්‍රයන් බිඳුවන්ට සුදුසු කථා කීමෙහි ස්වභාව ඇත්තාහ. එබැවින් ධ්‍යාන සැපය, මාර්ග සැපය, ඵල සැපය යන ත්‍රිවිධ සැපයෙන් නොපිරිහෙන්නැයි වදාරා ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ දහම් කතාව ගෙනහැර දක්වා චතුස්සත්‍යය දේශනා කොට වදාළ සේක. එම දේශනාවසානයෙහි උකටලී වූ මහණ තෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. මෙම ජාතක කතාවෙන් හෙළිවන අයුරු අපට උපකාරී වූවන්ට උපද්‍රවයන් සිදු නොකොට, දහම් මග හැසිරී මෙලොව, පරලොව ජය ගනිමු.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

# සදහම් ප්‍රහේලිකා අංක - 97

**ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773**

### උපදෙස් :


1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේළිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය අගෝස්තු මස 5 දා බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ▶ හරහට

1. දිවැස් ඇති තෙරණියන් අතරින් අගතැන්පත් තෙරණිය.
3. සොළොස් මහා ජනපදවලින් එකකි.
5. මෙය වැරදුණහොත් බොහෝ අකරතැබ්බවලට මුහුණ දීමට සිදුවේ.
6. සමහර අය තම විරෝධය පළ කරන්නට මේවා ගසති.
7. බෝසතුන්ගේ පංච මහා පරිත්‍යාගවලින් එකකි.
9. බොහෝ දෙනා ප්‍රිය එළවළු වර්ගයකි.
12. බෞද්ධ සංකල්පයක් මත නිර්මාණය කළ චිත්‍රපටයකි.
13. ගොවි උපකරණයකි.

### ▼ පහළට

2. සසර කෙටිකර ගැනීම සඳහා වහ වහා රුස්කර ගත යුතුය.
3. විවිධ පැහැයෙන් යුතු මල් වර්ගයකි.
4. බුදු දහමේ මෙය පරම ධනය ලෙස සැලකේ.
6. මෙම දිනයට බෞද්ධයෝ සිල් ගනිති.
7. ලග්න 12 ට අයත්ය.
8. සප්ත ආර්ය ධනයට අයත් වේ.
9. මේවා තලන විට සමහරුන්ට රජ මඟුල්ලු.
10. කම්සැප සඳහා ඇතිවන තෘෂ්ණාව.
11. දෙතිස් කුණපවලට අයත්ය.



## ප්‍රහේළිකා අංක 93 - 94 ජයග්‍රාහී වාසනාවන්තයින් නම්

- එස්. කලුආරච්චි, නො. 97, පළමු පටුමග, අරුප්පල, මහනුවර.
- ඒ. පී. මාලනී, 247/24, නාරන්දන්ඩවත්ත, අම්පිටිය.
- ඩී. කේ. අමරතුංග, ගංගොඩ, වාසෙල්වල.
- අජිත වනසිංහ, 30/16, බංගලාවත්ත, මහනුවර.
- සෝමා කුමාරි දිසානායක, 20/4, මාතලේ පාර, වත්තේගම.

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර එකොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක  
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය  
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න  
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

නූතනයේ අපරදිගින් ආසියාකරයට පැමිණෙන සත්ගුණවත් පෙනුමින් යුතු බොහෝ සංකල්ප අපේ කලාපයේ රටවල ඉතා ඉහළින් සුරක්ෂිත වූ හුදෙක් සංකල්පවලට සීමා නොවූ, ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ සාමාන්‍ය ජන ජීවිතයට බද්ධව පැවැති ඒවාය. උදාහරණයක් ලෙස කාන්තා නිදහස, ළමා හිංසනය, සත්ව හිංසනය, මානව අයිතිවාසිකම් යනාදිය ගත් කල අපේ රටේ පුරාතනයේ පටන් ඉතා හොඳින් ක්‍රියාත්මක පැවැති ඒවාය. බොහෝවිට බටහිර ශිෂ්ට සමාජයක් ඇතිවන්නටත් පෙර පටන් නූතනයේ ඔවුන් විසින් අපට ඉදිරිපත් කරනු ලබන අණපණත් අපේ රටේ ජනතාව තුළ ආචාර ධර්ම වශයෙන් ජනගතව පැවැතිණි. තත්ත්වය එසේ වෙද්දී වර්තමානයේදී අප වෙත ඉදිරිපත් වන ඇතැම් සත්ගුණවත් පෙනුමින් යුතු සංකල්ප මෙරටේ චිරාත් කාලයක් පැවත එන සංස්කෘතික දේහයටද අභියෝග කරන්නට පටන්ගෙන තිබේ. මීට සමීපතම උදාහරණය වන්නේ වර්තමානයේ කතිකාවතට ලක්වන සත්ව හිංසනය පිළිබඳ අදහසය. මේ කතිකාවත තුළ වඩාත් ඉස්මතුව ඇත්තේ අලි ඇතුන් පිළිබඳවය. ඒ අනුව ඊනියා සත්ව හිංසන විරෝධීන් කියා සිටින්නේ අලි


# සත්ව හිංසනය පිළිබඳ නූතන කතිකාව සහ බුදු සමයේ ජීව හිතවාදය



"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්."


ඇතුන් පෙරහර ආදී සංස්කෘතික කටයුතුවලට යොද ගැනීමෙන් ඔවුන් හිංසනයට ලක්වන බවය.

අලි ඇතුන් පිළිබඳව මෙරට බෞද්ධ සමාජයේ පවත්නේ පූජනීය ආකල්පයකි. දළදා වහන්සේ වැඩමවන හස්ති රාජයා පෙර පින් කළ ඇතකු ලෙසත්, මරණින් පසුව ඌ දෙව්ලොව උපදින බවත් අපේ සාමාන්‍ය ජනයා පවා විශ්වාස කරන්නකි. අලි ඇතුන් ආදරෙන් නහවා, නිසි පරිදි ආහාර ආදිය සපයා සර්වාභරණයෙන් සරසන මහජනයා ඉදිරියේ පෙරහරට එකතු කරන්නේ මහත් වූ අභිමානයෙනි. විශේෂයෙන් දළදා වහන්සේ වැඩම වන හස්ති රාජයා විශේෂයෙන් සරසා දළ ආදියට අත්‍යලංකාර කොහු ආදිය පළඳවා සුදු පාවඩමකින් වැඩම වනු ලැබේ. මේ අනුව අලි ඇතුන් පිළිබඳ ඊනියා පිරිස් ප්‍රකාශ කරන ආකාරයේ හිංසන මානසිකත්වයක් මෙරට තුළ නොමැති අතර ඔවුන් පිළිබඳ පවත්නා සාමාන්‍ය අදහස වන්නේ ගෞරවණීය, අභිමානනීය මෙන්ම කාරුණික අදහසකි. ඇතැම් විට එය දිව්‍යමය වූවකි. මෙරට තුළ අලි ඇතුන්ගේ ජීවිත මේ තරම්වත් සුරක්ෂිත වී ඇත්තේ බෞද්ධ සංස්කෘතිය තුළින් ඊට ලබාදී ඇති ආගමික මූලය පදනම් කරගෙනය. නොඑසේ නම් අලි ඇතුන් මිනිසාට කරදරකාරී සත්වයකු ලෙස මීට වඩා විනාශයට පත්වන්නට ඉඩ තිබිණි.



අලි ඇතුන් පිළිබඳ විශාල ඥාන සම්භාරයක් මෙරට තුළ පවතී. විශේෂයෙන් ඒ පිළිබඳව රචිත ග්‍රන්ථ රාශියක් පැරණි පුස්කොළ පොත් අතර පවතී. විශේෂයෙන් ඒ අතර පැරණි අලි ඇතුන් අල්ලා ගන්නා විධික්‍රම පිළිබඳව පවතින ශිල්ප ක්‍රම අධ්‍යයනයෙන් පෙනී යන්නේ ඔවුන්ට අවම හිංසනයක් සිදුවන ආකාරයෙන් අල්ලාගෙන පීඩාකාරී නොවන අන්දමින් හීලෑ කිරීම් සිදුකළ බවය. ඒ සඳහා වන වෙනම විද්‍යාවක්, ශාස්ත්‍රයක් 'අලි බාස් උන්නැහේලා' ඇත්ගොව්වන් තුළ පැවතිණි. අලින්ට වෙදකම් කිරීම මෙන්ම හස්ති දමන මන්ත්‍ර, අලි භාෂාව ආදී සංස්කෘතික කාරණා රාශියක්ම ඒ හා බැඳී තිබේ. විශේෂයෙන් පැරණි පළපුරුදු ඇත්ගොව්වන් ස්වකීය ජීවිතයම කැප කරන ලද්දේ තමන් රැක බලා ගත් හස්තියා වෙනුවෙනි. යම් විටෙක දඬුවම් කිරීමට සිදු වෙතොත් එයද සිදුකරන ලද්දේ අවම හිංසනයක් සිදුවන අයුරිනි. එයද වෛරී චේතනාවකින් නොව අවශ්‍ය තැනට අවශ්‍ය පරිදි හික්මවීම සඳහාය.

හින්දු මෙන්ම බෞද්ධ සංස්කෘති දෙකෙහිම අලි ඇතුන් පූජ්‍යත්වයෙන් සලකා ඇති බවට උදහරණ බොහෝය. මෙරට ප්‍රකට සම්භාවනීය බෞද්ධ දෙවියකු වන සුමන සමන් දෙවියන්ගේ වාහනයද ශ්වේත හස්ති වාහනය විය. සඳකඩ පහන ආදී ද්වාර මණ්ඩප සැරසිලි සඳහා අලි ඇතුන්ගේ රූප සිතුවම් බහුලව යොදගෙන තිබේ. ශ්‍රී දළදා මාලිගාවේද ඉදිරිපස පිවිසුම් ද්වාරය දෙපස අත්‍යලංකාර අයුරින් සරසන ලද ශෛලමය කැටයමින් යුතු හස්ති රූ එලක දෙකක් දැකිය හැකිය. ජාතක කථා ආදී සම්භාව්‍ය සාහිත්‍යයේ මෙන්ම ජාන සාහිත්‍යයේද අලි ඇතුන් පිළිබඳ ගොඩනැගුණු පුළුල් සාහිත්‍යයක් හඳුනා ගත හැකිය. අප මහා බෝධිසත්වයන් වහන්සේද



පාරමී පූරන සමයේ නොයෙක් විට අලි ඇතුන් ඉපිද තිබේ. එමෙන්ම බෝධි සම්භාර පූරන අවසන් ආත්ම භාවයේදී අලි ඇතා දන්දුන් වෙස්සන්තර ජාතකයේ විස්තරව තිබේ. දෙගල්දෙරුව ආදී විහාර සිතුවම්වල ඒවා අත්‍යලංකාරවත්ව සිතුවම් කොට තිබේ.

අපේ ඉතිහාසය තුළ මිනිසුන් මෙන්ම වීරෝධාර තිරිසන් සතුන්ද දැකිය හැකිය. එවැනි මිනිසුන්ට නොදෙවැනි වීර සත්වයකු ලෙස හස්තීන් සලකා තිබේ. හොඳම උදහරණය නම් දුටුගැමුණු රජතුමාගේ කඩොල් ඇතුය. වර්තමාන උදහරණය නම් ශ්‍රී දළද මාලිගාවේ වසර ගණනාවක් කරඬුව වැඩම වූ රාජා හස්තියාය. දැනට කෞතුකාගාරයක තැන්පත් කොට ඇති රාජා හස්තියාගේ පිළිරුවට දහස් ගණන් දෙස් විදෙස් ජනී ජනයා ගෞරව කරනු ලැබේ.

මේ ආදී වශයෙන් බලන කල අලි ඇතුන් පෙරහරට සම්බන්ධ කරගැනීම ආදී සංස්කෘතික කටයුතු සඳහා යොදගැනීම මෙරට අලිගහණයේ චිර පැවැත්මට හේතුවන්නක් මිස අවනතියට හේතුවන්නක් නොවන බව ඊනියා සත්ව හිංසන විරෝධීන් කල්පනා කළ යුතුය. ඒ පිළිබඳව ඔවුන් පුළුල් අධ්‍යයනයක් කරන්නේ නම් මේ බව හොඳින් වැටහෙනවා ඇත.

බෞද්ධ සංස්කෘතිය තුළ සාකච්ඡා කෙරෙන්නේ මිනිසා කේන්ද්‍ර කරගත් අවිහිංසාවක් නොවේ. එය මුළුමහත් ජීව ලෝකයම ආවරණය කෙරෙන්නකි. අලින් මෙන්ම කුකුළන්, එළුවන්, හරකුන් ආදීහුද සත්වයෝය. ඔවුන්ගේද ප්‍රාණය සුරැකිය යුතුය. කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි මහා ජීවියාගේ පටන් ඇසට නොපෙනෙන කුඩා ජීවියා දක්වාම මවක් ස්වකීය එකම පුතුට දක්වන මෛත්‍රියට සමානව මෙත් සිත පැතිරවිය යුතුය.

මෙවන් දර්ශනයක් තුළ වැඩුණු සංස්කෘතියක හස්තීන් පෙරහර ආදී සංස්කෘතික කටයුතුවලට යොදගැනීම සත්ව හිංසනයකැයි අර්ථ ගැන්වීම සංවේගදයීය. අපේ සංස්කෘතික උරුමයට සහ එහි අභිමානයට නොසතුටු යම් පිරිසක් මේ පසුපස සිටිත්දැයි අපේ බෞද්ධයිනුත්, මහා සංඝරත්නයක් අවදියෙන් සිටිය යුතුය.

**හෙම්මාතගම පියදස්සී හිමි**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# ඔබේ දරුවා දහම් පාසලට යැවිය යුත්තේ ඇයි..?

යටත් විජිත පාලන සමයේ ක්‍රිස්තියානිවරු තම දරුවන්ට ආගම ඉගැන්වීම අතපසු නොකරද්දී බෞද්ධ දරුවන් එසේ ආගම ඉගෙනීම අතපසු කරන්නේ ඇයිදැයි ප්‍රශ්නයක් විය. බෞද්ධාගම හුදකලා වී ඇති යුගයක එය නව පණක් දෙන්නට ඕල්කට්තුමා ඇතුළු පිරිස මහත් මෙහෙයක් සිදුකළහ. එහි වටිනාම තිළිණය වූයේ 1895 අගෝස්තු 3 වන දින ඇරඹි ගාල්ලේ වැලිවත්ත විජයානන්ද දහම් පාසලය. බොදු දරුවන් අන්‍යාගමික පාසල්වලට යවනු ලැබූවත් පාරම්පරික දහමෙහි මූලික කරුණු හෝ ඉගැන්වීම කළ යුතු බව අදිටන් කොට සතියේ විශේෂ දිනයක විහාරස්ථානය හා භික්ෂූන් වහන්සේ ඇසුරු කොට සදාචාරවත් දරු පරපුරක් මේ පින්බිමට තිළිණ කිරීමේ යහපත් ක්‍රියා පිළිවෙත ආරම්භ කළේය. එසේ සියවසකටත් වැඩි කාලයක දැනුම වර්ධනයට පමණක් නොව සදාචාරවත් පුද්ගලයකු සමාජයට බිහිකිරීමේ තක්සලාව ලෙස දහම් පාසල වැජඹුණි. නමුත් මිෂනාරි අධ්‍යාපනයට නොදෙවෙනි ලෙස ටියුෂන් මාෆියාව අද වන විට ඉරිදා දහම් පාසල ගිල ගෙන ඇති බව තතු දන්නෝ හොඳින් දනිති.

විභාග මූලික වූ පාසල් අධ්‍යාපනයෙන් හිස පුරවා කල් ගෙවන දරුවන්ට තම ජීවිතය සදාචාර සම්පන්න ලෙස කෙසේ හැඩගස්සවාගත යුතුදැයි කියාදෙනුයේ දහම් පාසලය. එබැවින් එය එකම තක්සලාවකි. එහිදී දරුවන්ගේ මනසට මෙන්ම හදවතටද කතා කරනු ඇත. දහම් පාසල් ගුරුවරයා ශිෂ්‍යයා අතර ඇත්තේ පිය-පුතු බැඳීමකි. එබැවින් ඒ තුළින් බිහිවන දරුවා මනුෂ්‍යත්වයේ සංකේතයකි. නමුත් නූතන පාසල් අධ්‍යාපනයේ පිය-පුතු දෙපිරිසම ගමන් කරන්නේ භෞතික සංවර්ධනය අපේක්ෂාවෙන්ය. එබැවින් ජීවිතය පිළිබඳ පාඩම තේරුම් ගන්නට පාසල් අධ්‍යාපනයෙන් ලැබෙනුයේ සීමිත ඉඩකඩකි. පාසල් අධ්‍යාපනයෙන් පරිබාහිරව ලබන දහම් පාසල් අධ්‍යාපනය රැකියාවකට සුදුසුකමක් නොවන නිසාවෙන් බොහෝ දෙමාපියෝ දරුවන් ඉරිදා දිනයේ දහම් පාසල් යවනවා වෙනුවට උපකාරක පන්ති වෙත රැගෙන

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"




යති. සෑම දෙමාපියකුගේම බලාපොරොත්තුව වන්නේ තමාගේ දරුවා උසස් රැකියාවක නිරත කරවීමය. එබැවින් තරගකාරී අධ්‍යාපන ක්‍රමය තුළ සතියේ දින හත දරුවන්ට ප්‍රමාණවත් වුවත් ඇතැම් දෙමාපියන්ට ප්‍රමාණවත් නොවන බව හොඳාකාරවම දනිමු. දහම් පාසලෙන් දරුවාගේ ආකල්ප වර්ධනය කරන අතරතුර ආගමික භක්තියද වර්ධනය කරනු ලැබේ. එබැවින් දරුවන් තුළ ගුණගරුක බව, ත්‍යාගශීලීත්වය, කරුණාව, දයාව, මිතුරුකම, පරාර්ථකාමීත්වය ආදී යහපත් ගුණාංග වර්ධනය වනු ඇත. නමුත් දෙමාපියන්ට අවශ්‍ය වී ඇත්තේ ප්‍රගති වාර්තාවේ විෂයයන් සඳහා වූ ලකුණු පමණි. එබැවින් වටහා ගත යුතුව ඇත්තේ එකම දිශාවකට ගමන් කරන දෙමව්පියෝ තම වගකීමෙන් බැහැර වී ඇති බවය. එබැවින් එහි අවසන් ඵල විපාකය වනුයේ දරුවන් නොදරුවන් වීමය.

අද වන විට වර්ධනය වෙමින් පවතින උපකාරක පන්ති නිසාවෙන් දහම් පාසල් නොඑන දරු පිරිසද බොහෝය. ඇතැම් ළමුන් දහම් පාසල් පැමිණිය දැහිත උපකාරක පන්තියේය. ටියුෂන් පන්තියේ පාඩම අතපසුවීම මෙන්ම ඊට මුදලක් නිර්ණය වීම යන සාධක මත දරුවන් එසේ කටයුතු කිරීම සාධාරණය. ඇතැම් ගුරුවරුන්ගේ සුරංගනා ලෝක දකින්නට, විඳින්නට කැමති දරුවෝ දහම් පාසල් පැමිණියද අවසන් වීමට මත්තෙන් දහම් පාසලෙන් අවසර ගෙන බැහැරව යති. ඇතැම් විට එසේ බැහැරව යන්නේද මුසාවාද කිලෝ ගණන් ඇද බෑමෙන් පසුවය. දෙමාපියෝද දහම් පාසල අවසන් වනතුරු නොඉවසිල්ලෙන් බලා සිටින්නේ ටියුෂන් පන්තියට ඇදගෙන යෑමටය. මෙලෙස විධිමත් ලෙස දහම් පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යෑමට ඉරිදා ටියුෂන් පන්තිය සෘජු බලපෑමක් වී හමාරය.

ගුරුවරයා යන වදනෙහි තේරුමවත් නොදත් ඇතැම් ටියුෂන් ගුරුවරු මුදලට දැනුම විකුණන පිරිසක් බවට පත්ව ඇත්තාහ. ඔවුනටද සතියේ දින හතට අමතරව තවත් දිනයක් හඳුන්වා දෙන්නට ඉඩහසර ඇත්නම් ඒ සඳහාද නව පන්තියක් වෙනුවෙන් කාලය වෙන්කරන්නට සීරුවෙන් බලා සිටිනු ඇත. සෑම ගුරුවරුම මෙලෙස ක්‍රියා නොකරන බවද කිව යුතුය.

දහම් පාසලටද සමාජයේ කිසියම් වටිනාකමක් හිමිව තිබේදැයි බැලිය යුතුය. දහම් අධ්‍යාපනයේ වටිනාකම් මිල කරන්නට නොහැකි බව සියල්ලෝම දන්නා කරුණක් වුවත් ප්‍රායෝගිකව ගත් කල නූතන සංවර්ධන ක්‍රියාදාමයන් තුළ මෙකී ආයතනයද කිසියම් භෞතික වටිනාකම් රාශියකට කැඳවන බව අපගේ විශ්වාසයයි. වර්තමානයේ සම්මුඛ පරීක්ෂණ සඳහා දහම් පාසල් ශ්‍රේණි විභාග වෙනුවෙන් ලබාදෙන සහතික පත් ඉදිරිපත් කෙරුවත් පරීක්ෂකවරු එම සහතික පත් හැරෙන්නට අනෙක් සියලු දේ විමසා බලති. එපමණක් නොව දහම් පාසල් අධ්‍යාපනය ලැබුවාද යන්නවත් අසන්නේ නැත. ආයතනයට අවශ්‍ය වන්නේ හරකෙකු වුවත් වැඩ කිරීමට සමතෙකි. එබැවින් දහම් පාසල් ගිය නොගිය බව ඔවුනට ගැටලුවක් නොමැත. මෙලෙස මේ අයුරින් සිදුවන ක්‍රියාපටිපාටිය මගින් පහළ සිසු දරුවන්ට ගෙන එන ප්‍රධාන ආකල්පය නම් දහම් පාසල වැඩක් නැත යන්නය. ඇතැම් ආයතන මේ



සඳහා යම් සලකා බැලීමක් සිදුකරන අතර එයට අප ප්‍රශංසා කළ යුතුය.

එසේ නම් වගකිව යුතු සැමගේ යුතුකම ජාතික වගකීමක් ලෙස ගෙන දහම් පාසල් අධ්‍යාපනය සඳහා අලුත් ඇසකින් බැලීමය. නොහික්මුණු දරු පරපුරක් අභියස රට පාලනය කිරීම පවා අභියෝගක් බව දේශපාලකයන් පවා තේරුම් ගත යුතුය.

දැන් කළ යුතුව ඇත්තේ දරුවාට සාරධර්ම කියා දී යහපත් මිනිසකු කිරීමය. එබැවින් ඉරිදා දහම් පාසලෙහි වටිනාකම් හඳුනාගෙන ඊට නිසි දයකත්වයක් ලබාදී විධිමත් දහම් අධ්‍යාපනයකට අනාගත දරු පරපුර යොමු කළ යුතු බව ඉඳුරා පැවැසිය යුතුය.

**ඉනේෂ් අබේනායක**